

# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# ANNUAL REPORT 2016




**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

சுகததாச தேசிய விளையாட்டுக் கட்டிடத்தொகுதி அதிகாரசபை

**SUGATHADASA NATIONAL SPORTS COMPLEX AUTHORITY**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

# වාර්ෂික වාර්තාව
# 2016

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය


1. තොරතුරු සම්බන්ධීකරණය........ 03
2. ක්‍රීඩාංගන පාලක කළමණාකාරීත්වය ........ 03
3. අපගේ දර්ශනය සහ අපගේ මෙහෙවර........ 04
4. සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම........ 05
5 ආයතනයේ සංවිධාන ව්‍යුහය........ 06
6. අනුමත කාර්ය මණ්ඩලය........ 07
7. මෙම අධිකාරියේ වගකීම් හා කාර්යයන්........ 08
8. කළමනාකරණය ........ 09
9. පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර........ 09
10. මානව සම්පත් සංවර්ධනය........ 10
11. කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් වාර්තාකරණය........ 11
12. 2016 වර්ෂය සඳහා සුජාක්‍රිසංඅ යේ විගණන කාර්යය........ 19
13. වාර්ෂික ප්‍රසම්පාදනය........ 20
14. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය........ 21
    ගෘහස්ථ ක්‍රීඩාගාරය........ 22
    උප ක්‍රීඩාගාරය........ 24
    පිහිනුම් තටාක සංකීර්ණය........ 25
    කායවර්ධන මධ්‍යස්ථානය........ 26
    ක්‍රීඩා හෝටලය........ 27
15. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 28
16. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ 2017 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති........ 28
17. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය........ 29
18. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 30
19. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ 2017 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති........ 31
20. ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය........ 31
21. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය........ 32
22. බෙලිඅත්ත සහ වීරකැටිය පිහිනුම් තටාක........ 33
23. නුවරඑළිය තුරඟ තරඟ පිටිය........ 35
24. ආයතනයේ සමස්ථ ප්‍රගතිය........ 36
25. ගිණුම්කරණ ප්‍රතිපත්ති 2016 ........ 37
26. ආදායම් වියදම් ප්‍රකාශය........ 42
27. ශේෂ පත්‍රය........ 43
28. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය........ 44
29. විගණකාධිපති වාර්තාව හා යාවත්කාලීන තොරතුරු ........ 45

# තොරතුරු සම්බන්ධීකරණය

## ආයතනයේ නම - සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ප්‍රතිස්ථාපනය කිරීම නීතිමය වශයෙන් 1999 අංක 17 දරන පාර්ලිමේන්තු පනත මගින් නීතිගත කර ඇත.

### කළමනාකාරීත්ව මණ්ඩලය

බ්‍රිගේඩියර් ජේඑම්එස්එස් ජයසුන්දර ආර්එස්පි,යූඑස්පි- සභාපති
කේඩීඑස් රුවන්චන්ද්‍ර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
(2016 ජූනි දක්වා)
එස්ආර් ටීඑම්එස්පී බණ්ඩාර මහතා - සාමාජික
(2016 ජූනි දක්වා)
සන්ධ්‍යා සිරිමාන්න මිය - සාමාජික
(2016 ජූලි සිට)
එස්ඩබ් මදනායක මහතා - සාමාජික
( අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)
එස්ආර් ටීඑම්එස්පී බණ්ඩාර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
(2016 ජූලි සිට)
කේජ් ආලෝක ශ්‍රී කාන්ත මහතා - සාමාජික
අයිආර්යූ මහේෂ් විජේරත්න මහතා - සාමාජික
ඩබ්ටීපී කබ්‍රාල් මහතා - සාමාජික
සුනිල් ගුණවර්ධන මහතා - සාමාජික
සම්පත් දිසානායක මහතා - සාමාජික
එච්එල්එම්එස් බණ්ඩාර මහතා - සාමාජික
ඒඑම් රකිබ් මහතා - සාමාජික

### බැංකුව

ලංකා බැංකුව - ග්‍රෑන්ඩ්පාස් ශාඛාව

### විගණනය

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දුව පාර,
බත්තරමුල්ල.

### ලිපිනය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය,
තැ.පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,
කොළඹ 13.

දුරකථන : 011-2445677, 2422841
011-2384490, 2384385
ෆැක්ස් : 011-2445675
විද්‍යුත් තැපැල : sugathad@sltnet.lk

### විගණන හා කළමනාකරණ කමිටුව

එස්ඩබ් මදනායක මහතා - සභාපති
( අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)
එස්ආර් ටීඑම්එස්පී බණ්ඩාර මහතා - සාමාජික
(අධ්‍යක්ෂ ජෙනරාල් - ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව)
කේජේ ශ්‍රීකාන්ත මහතා - සාමාජික
එච්ජේඩබ් අභයකුමාර මහතා - සාමාජික
(ප්‍රධාන අභ්‍යන්තර විගණක - ක්‍රීඩා අමාත්‍යාංශය)
ටීඑල්ටී මධුෂානි රණවීර මිය - ලේකම්

නිරීක්ෂණ මට්ටමින් වූ සහභාගීත්වය

ඩීඑස්ඒඑස් අනුලසිරි මහතා - සාමාජික
(විගණක අධිකාරී- රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව)

තුන්වන විගණන හා කළමනාකරණ කමිටුවට සහභාගී වූ නිලධාරීන්
එස්ටී රත්නායක මහතා
(විගණක අධිකාරී- රජයේ විගණකාධිපති දෙපාර්තමේන්තුව)
ගාමිණී චන්ද්‍රසිරි මහතා - ලේකම් (වැ.බ.)

### ක්‍රීඩා සංකීර්ණ පාලක මණ්ඩලය

බ්‍රිගේඩියර් ජේඑම්එස්එස් ජයසුන්දර ආර්එස්පි,යූඑස්පි- සභාපති
එස්එස්කේ ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ
චමින්ද කේ උඩුකුඹුර මහතා - සහකාර අධ්‍යක්ෂ (පාලන)
සීඑච්ජේ රූපසිංහ මහතා - සහකාරඅධ්‍යක්ෂ(මූල්‍ය)
ඩබ්එම්වයිඒ විජේසූරිය මෙනවිය - සහකාරඅධ්‍යක්ෂ(ක්‍රීඩා)
එම්එම් අජිත් රණසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ(තාක්ෂණික)
ගයනි දීපිකා කුමාරි මිය - සහකාර අධ්‍යක්ෂ(තාක්ෂණික)
(2016 අගෝස්තු සිට)
කපිල මුනසිංහ මහතා - නීති නිළධාරී
ටීඑල්ටීඑම් රණවීර මෙනවිය - විගණක නිළධාරී
කේ බන්දුතිලක මහතා - තොරතුරු තාක්ෂණ නිළධාරී
පීඩීඑන් ප්‍රභා කිරිඇල්ල මිය - ක්‍රීඩාංගන කළමනාකරු (එළිමහන්)
පීඩී සම්පත් පෙරේරා මහතා - ක්‍රීඩාංගන කළමනාකරු (වෙන්කිරීම්)
මේජර් එච්පී උපාලි ගමගේ - ක්‍රීඩාංගන කළමනාකරු (ආරක්ෂක)
ඩීඩීඑස් ලියනාරච්චි මිය - ක්‍රීඩාංගන කළමනාකරු (ගෘහස්ථ)
එස්එම්අයි සිල්වා - ක්‍රීඩාංගන කළමනාකරු (බෝගම්බර)
ශානිකා ප්‍රභාෂ්වරී මෙනවිය - අලෙවි/ මිළදීගැනීම් නිළධාරී

### සම්පාදනය

අධීක්ෂණය :
එස්එස්කේ ගුණවර්ධන (අධ්‍යක්ෂ)
සී අනුරාධ විදානගමාච්චි (සහකාර අධ්‍යක්ෂ - පාලන)
එච් අනෝජා ප්‍රියදර්ශනී (පරිපාලන නිළධාරී)
පරිඝණක යතුරු ලියනය :
අජිත් ඉන්දික සෙනවිරත්න (කළමනාකරණ සහකාර)
එම් තිළිණ සගිරංග මුතුනායක (කළමනාකරණ සහකාර)
භාෂා පරිවර්තනය (දෙමළ,ඉංග්‍රීසි) :
එම් නුස්රාත් මහතා (රජයේ භාෂා පරිවර්තක)
මුද්‍රණය : සැලැසිනෙ රූපවාහිනී ආයතනය

# අපගේ දර්ශනය සහ මෙහෙවර




### දැක්ම

ආසියාවේ පළමු පෙළේ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා පහසුකම් සහිත ක්‍රීඩා සංකීර්ණයක් බවට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පත්කිරීම සහ එය සතු අනෙකුත් ක්‍රීඩා සංකීර්ණ දියුණු කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සංවර්ධනයට පහසුකම් සහනදායීව ලබාදීම.




### මෙහෙවර

ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම මගින් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ දියුණුවට දායකවීම සහ ශ්‍රී ලාංකික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ කුසලතා ඔප් නැංවීමට අවැසි පහසුකම් සහිත ප්‍රමුඛතම ජාත්‍යන්තර සංකීර්ණයක් බවට පත්වීම.

# සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිහිටුවීම



සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය භාරකාර අරමුදලක් ලෙස 1995.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ක්‍රීඩා අමාත්‍යාංශයට පවරා ගනු ලැබූ අතර, 1999 අප්‍රේල් මස 20 වන දින සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියක් බවට පත්කිරීමේ 1999 අංක 17 දරන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එකී පනත 1999.09.01 දින සිට බලපාන සේ සම්මත වූ අතර, එදින සිට මෙම ජාතික ක්‍රීඩා සංකීර්ණය, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ලෙස ස්ථාපිත කරන ලදී.

මෙම අධිකාරියේ කළමනාකරණ කටයුතු ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරන කළමනාකාරීත්ව මණ්ඩලයක් මඟින් සිදුකරන අතර, එම මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

1. සභාපති - ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.
2. ක්‍රීඩා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ නියෝජිතයෙකු.
3. ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනත යටතේ පත්කරනු ලැබෙන ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්.
4. භාණ්ඩාගාරයේ නියෝජිතවරයෙකු.
5. මීට අමතරව, ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබෙන සාමාජිකයින් 07 දෙනෙකු.


සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - සංවිධාන ව්‍යුහය
සභාපති
අධ්‍යක්ෂ(1)
HM (1-1) - 1
MM (1-3) - 5
JM (1-1) - 10
MA (2-1) - 5
MA (1-1) - 55
PL (3) - 7
PL (2) - 17
PL (1) - 224
Technical Assist. (Elec/Civil) (01)
Carpenter(02), Mason(03), Welder(03), Plumber(01), Painter(02)
Carpenter(01) Plumber(01), Painter(01)
සමස්ථ එකතුව - 324

# අනුමත කාර්ය මණ්ඩලය

කළමනාකාරිත්ව මණ්ඩල සාමාජිකයින්ට අමතරව ආයතනයේ අනුමත බඳවාගැනීමේ පටිපාටියේ පරිදි ස්ථිර මුළු සේවක සංඛ්‍යාව 343ක් වේ. 2016.12.31 දිනට එම අනුමත සේවක සංඛ්‍යාවෙන් ආයතනයේ සේවය කළ සේවක සංඛ්‍යාව 94%ක් පමණ වේ. එය පහත පරිදි සවිස්තරාත්මකව දැක්විය හැකිය.

| අංක | තනතුර | වැටුප් කාණ්ඩය | අනුමත ස්ථිර සේවක සංඛ්‍යාව | කොන්ත්‍රාත් පදනම මත අනුමත සේවක සංඛ්‍යාව | 2016.12.31 දිනට සේවක සංඛ්‍යාව | 2016.12.31 දිනට කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු අතිරික්තය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | සභාපති | | 1 | - | 1 | - | 0 |
| 2 | අධ්‍යක්ෂ | HM 1-1 | 1 | - | 1 | - | 0 |
| | **මධ්‍යම මට්ටමේ කළමනාකරු** | | | | | | |
| 3 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (පාලන) | MM 1-3 | 1 | - | 1 | - | 0 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) | | 1 | - | 1 | - | 0 |
| 5 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) | | 1 | - | 1 | - | 0 |
| 6 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (තාක්ෂණික) | | 1 | - | 1 | - | 0 |
| 7 | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | | 1 | - | 0 | - | 1 |
| 8 | නීති නිලධාරී | | 1 | - | 1 | - | 0 |
| | **කනිෂ්ඨ කළමනාකරු** | | | | | | |
| 9 | සභාපතිතුමාගේ පෞද්ගලික ලේකම් | JM 1-1 | 0 | 1 | 0 | 1 | 0 |
| 10 | අභ්‍යන්තර විගණක | | 1 | - | 1 | - | 0 |
| 11 | පරිපාලන නිලධාරී | | 1 | - | 0 | - | 1 |
| 12 | ගිණුම් නිලධාරී | | 1 | - | 0 | - | 1 |
| 13 | තොරතුරු තාක්ෂණ නිළධාරී | | 1 | - | 1 | - | 0 |
| 14 | නඩත්තු නිළධාරී | | 1 | - | 1 | - | 0 |
| 15 | මිළදී ගැනීමේ නිළධාරී/ අලෙවි නිළධාරී | | 1 | - | 1 | - | 0 |
| 16 | ආරක්ෂක කළමනාකරු | | 1 | - | 1 | - | 0 |
| 17 | ක්‍රීඩාංගන කළමනාකරු (ගෘහස්ථ) | | 1 | - | 1 | - | 0 |
| 18 | ක්‍රීඩාංගන කළමනාකරු (එළිමහන්) | | 1 | - | 1 | - | 0 |
| 19 | ක්‍රීඩාංගන කළමනාකරු (බෝගම්බර) | | 1 | - | 1 | - | 0 |
| 20 | ක්‍රීඩාංගන කළමනාකරු (බෙලිඅත්ත) | | 1 | - | 1 | - | 0 |
| | **කළමනාකරණ සහකාර (තාක්ෂණික)** | | | | | | |
| 21 | තාක්ෂණික සහකාර (සිවිල්) | MA 2-1 | 1 | - | 0 | - | 1 |
| 22 | තාක්ෂණික සහකාර (විදුලි) | | 1 | - | 1 | - | 0 |
| 23 | ගබඩා භාරකරු | | 3 | - | 3 | - | 0 |
| 24 | පොත් තබන්නා | | 1 | - | 1 | - | 0 |
| | **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)** | | | | | | |
| 25 | කළමනාකරණ සහකාර | MA 1-1 | 31 | - | 26 | - | 5 |
| 26 | භූමි පාලක | | 1 | - | 1 | - | 0 |
| 27 | වැඩ පරීක්ෂක | | 2 | - | 2 | - | 0 |
| 28 | ක්‍රීඩා නිළධාරී | | 8 | - | 5 | - | 3 |
| 29 | ක්‍රීඩා පුහුණුකරු* | | 1 | - | 1 | - | 0 |
| 30 | ප්‍රධාන ආරක්ෂක නිළධාරී | | 3 | - | 3 | - | 0 |
| 31 | ආරක්ෂක නිළධාරී | | 17 | - | 17 | - | 0 |
| 32 | කළමනාකරණ සහකාර (ස්ථාන භාර නිළධාරී) නුවරඑළිය | | 1 | - | 0 | - | 1 |
| 33 | ආරක්ෂක නිලධාරී (පාලක) නුවරඑළිය | | 1 | - | 0 | - | 1 |
| | **ප්‍රාථමික ශිල්පීන්** | | | | | | |
| 34 | විදුලි කාර්මික* | PL 3 | 1 | - | 1 | - | 0 |
| 35 | රියදුරු | | 6 | - | 6 | - | 0 |
| | **ප්‍රාථමික අර්ධ ශිල්පීන්** | | | | | | |
| 36 | වඩු කාර්මික | PL 2 | 3 | - | 3 | - | 0 |
| 37 | පෙදරේරු | | 3 | - | 3 | - | 0 |
| 38 | වැද්දුම්කරු | | 3 | - | 3 | - | 0 |
| 39 | පින්තාරු | | 3 | - | 3 | - | 0 |
| 40 | පැස්සුම්කරු | | 3 | - | 3 | - | 0 |
| 41 | බයිසිකල් පණිවිඩකරු | | 2 | - | 2 | - | 0 |
| | **ප්‍රාථමික අර්ධ ශිල්පීන් නොවන** | | | | | | |
| 42 | ක්‍රීඩාංගන සහායක | PL 1 | 111 | | 110 | - | 1 |
| 43 | ආරක්ෂක නියාමක | | 108 | | 104 | - | 4 |
| 44 | කාර්යාල කාර්ය සහායක | | 10 | - | 10 | - | 0 |
| | | **එකතුව** | **342** | **1** | **323** | **1** | **19** |

# අධිකාරියේ වගකීම් හා කාර්යයන්

## වගකීම්

1. කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම සහ ජාතික වත්කමක් ලෙස සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආරක්ෂා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

2. සියලු පහසුකම් සහ සේවා නඩත්තු කරගෙන යාම.

3. ගොඩනැගිලිවලට හා ව්‍යුහවලට අවශ්‍යවන වැඩිදියුණු කිරීම් හෝ වෙනස්කිරීම් සිදු කිරීම.

4. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට හා විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට ක්‍රීඩාවෙහි ස්වකීය හැකියාව වැඩි දියුණු කරගැනීම සහ ඔවුන්ගේ කායවර්ධන හා සෞඛ්‍යය වැඩිදියුණු කරගැනීමට හැකිවන සේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව පහසුකම් ඔවුනට ලබාදීම.

5. විශේෂයෙන්ම ග්‍රාමීය අංශවල ක්‍රීඩා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව ක්‍රීඩා පිළිබඳ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් පවත්වා ගෙනයාම.

6. ජාතික හා අන්තර්ජාතික උත්සව සඳහා අවශ්‍ය පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව ලබාදීම.

7. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා සහ විනෝදාත්මක පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව, ජාත්‍යන්තර සහ දේශීය ක්‍රීඩා පුහුණු සංවිධානය, ක්‍රීඩා ආයතන සමග සම්බන්ධීකරණය සහ සම්බන්ධතා ඇති කරගැනීම.

8. අප අධිකාරියේ පහසුකම් කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පනවනු ලබන කොන්දේසිවලට යටත්ව සාධාරණ ගාස්තුවකට පාසැල්වලට, තරුණ ක්‍රීඩා සමාජවලට සහ ක්‍රීඩා සංවිධානවලට සැපයීම.

## කාර්යයන්

1. ඉහත වගකීම් ඉටුකරනු වස් අප අධිකාරිය විසින් පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ජාතික ක්‍රීඩා සංගම්, පාසල් ක්‍රීඩා සංගම් හා රාජ්‍ය මෙන්ම පෞද්ගලික ආයතන සඳහා කළමනාකාරීත්ව මණ්ඩලය මගින් අනුමත කළ සහනදායි ගාස්තු යටතේ සේවා හා පහසුකම් සපයනු ලැබේ.

2. ජාතික හා ජාත්‍යන්තර ජවන හා පිටිය ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.

3. ජාත්‍යන්තර මට්ටමේ තරඟ දිවා කාලයේදී මෙන්ම රාත්‍රී කාලයේදී පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

4. අඩු පහසුකම් සහිත පාසැල් හා ග්‍රාමීය මට්ටමේ දක්ෂතා සපිරි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සපයාදීම මඟින් ඔවුන්ගේ දක්ෂතා වැඩිදියුණු කරගෙන ඉදිරියට ඒමට අවශ්‍ය පහසුකම් සැපයීම.

5. ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ පිහිනුම් තරඟ පැවැත්වීමට අවශ්‍ය පිහිනුම් හා කිමිඳුම් තටාකාංගන පහසුකම් සැපයීම.

6. විභාග, සම්මන්ත්‍රණ, සමුළු හා උත්සව, විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

7. පුහුණු වැඩමුළු සංවිධානය කිරීම.

# කළමනාකරණය

## පහසුකම් සහ සේවා සපයනු ලබන ක්ෂේත්‍ර

දිවා කාලයේ මෙන්ම රාත්‍රී කාලයේදී ද පහසුකම් සහ සේවා සැපයීමේ සුවිශේෂ හැකියාවන් සතු සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ක්‍රීඩා, සෞඛ්‍ය, අධ්‍යාපන මෙන්ම විනෝදාස්වාද යන ක්ෂේත්‍ර සඳහා පහසුකම් සහ සේවා සැපයීමෙන් ජාතික වශයෙන් අති විශාල දායකත්වයක් දරයි. විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීමේ ප්‍රමුඛතම ආයතනය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියයි.

### ක්‍රීඩා

මලල ක්‍රීඩා, රගර්, දැල්පන්දු, ක්‍රිකට්, පැසිපන්දු, ස්කොෂ්, අත්පන්දු, බැඩ්මින්ටන්, මේසපන්දු, ජූඩෝ, මල්ලවපොර, වුෂූ, බොක්සිං, ටයිකොන්ඩෝ, කරාතේ, ජිම්නාස්ටික් යනාදී ක්‍රීඩා සඳහා ජාත්‍යන්තර මට්ටමේ පහසුකම් සැපයීම.

### සෞඛ්‍ය හා අධ්‍යාපනය

ජාතික හා ජාත්‍යන්තර උත්සව, වැඩමුළු, පුහුණු පාඨමාලා, පිහිනුම් හා ජීවිතාරක්ෂක පාඨමාලා, කායවර්ධන පාඨමාලා, සංදර්ශන, රැස්වීම් සඳහා ජාත්‍යන්තර මට්ටමේ සේවා සහ පහසුකම් සැපයීම.

### විනෝදාස්වාදය

ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ මහා පරිමාණ සංදර්ශන සඳහා සේවා හා පහසුකම් සැපයීම.

### වෙළෙඳ ප්‍රචාරණ හා දැන්වීම්

අලෙවිකරණයට අදාළ නිශ්චල ඡායාරූප ගැනීමට සහ වීඩියෝ පට සඳහා අවශ්‍ය පසුතල ලබාදීම මඟින් සේවා සහ පහසුකම් සැපයීම. අතිශයින් ජනප්‍රිය වෙළෙඳ දැන්වීම් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය ආශ්‍රිතව රූගත කර ඇති බව සඳහන් කළයුතුව ඇත.

**ඉහත සේවා සහ පහසුකම් සැපයීම සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පහත සඳහන් ආයතනවලින් සමන්විත වේ.**

1. සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය හා පිහිනුම් තටාක සංකීර්ණය
2. සුගතදාස ක්‍රීඩා හෝටලය
3. සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය
4. ආර්.ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය
   (2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට බදු දී ඇත.)
5. බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය
6. බෙලිඅත්ත හා වීරකැටිය පිහිනුම් තටාක
7. නුවරඑළිය තුරඟ තරඟ පිටිය

# මානව සම්පත් සංවර්ධනය

2016 මූල්‍ය වර්ෂය තුළ සේවක අභිප්‍රේරණය සහ කුසලතා වර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද වර්ෂයකි. එම වර්ෂය තුළ පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන්ට අනුකූලව පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ලබාදීමට ඉහළ පාලනාධිකාරිය කටයුතු කර ඇත.

| අ.අ. | පාඨමාලාව | කාලසීමාව | සහභාගිත්වය | මුදල (රු.) |
|---|---|---|---|---|
| 01 | Workshop on Surge Protection Critical Facilities; An End use Perspective On Power Quality. | 2016.02.03 to 2016.11.06 | 01 | 4,500.00 |
| 02 | Olympic Solidarity Sports Administration.(OSSAC) 2016 | 2016.04.30 to 2016.05.03 | 02 | 6,000.00 |
| 03 | Olympic Solidarity Sports Administration.(OSSAC) 2016 | 2016.02.03 to 2016.11.06 | 02 | 6,000,00 |

# කළමනාකාරීත්ව වාර්තාකරණය

ආයතනික මාසික ප්‍රගතිය ක්‍රීඩා අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම අඛණ්ඩව මාසිකව සිදුකරන අතර, තුන්වන කාර්තුව අවසානයේ පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන කාර්යසාධන වාර්තාව නිසි පරිදි ඉදිරිපත් කිරීමටත්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව යන ආයතන වෙත සංඛ්‍යාංක දත්ත ඉදිරිපත් කිරීමටත් කටයුතු කර ඇත.

# 2016 වර්ෂයට අදාළ කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම්

මෙම අධිකාරියේ අභිවෘද්ධියට අදාල තින්දු තිරණ ගැනිම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සිදුකරන අතර, ඊට අදාළ රැස්වීම් මාසිකව පැවැත්වේ. 2016 වර්ෂයට අදාළව කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීම් 10ක් පවත්වා ඇති අතර, එම රැස්වීම්වලදී ලබාගත් වැදගත් තිරණ පහත පරිදි ඉදිරිපත් කළ හැක.

| අ.අ | දිනය | කාරණය | විස්තරය |
|---|---|---|---|
| 01 | 2016 ජනවාරි | 2015 වසර සඳහා සේවක සුහසාධන අතුරු දීමනාව ගෙවීම | 2015-12-09 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2015 ට අනුකූලව සේවක මණ්ඩලයට රු 2,000/- බැගින් (එක් අයෙකුට) ප්‍රසාද දීමනාවක් ලබාදීමට 2015-12-17 වන දින රැස්වූ කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමත කරන ලදී.<br><br>නමුත්, කාර්යය මණ්ඩලයේ සේවක සේවිකාවන් විසින් 2014 වර්ෂයේ මෙන් රු5,000/- ක ප්‍රසාද දීමනාවක් ලබාදෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, එම අදල මුදල ගෙවීමට හැකියාව ඇත්දැයි සොයා බැලීමට කමිටුවක් පත්කරන ලද අතර, එම කමිටුව මඟින් රු1,500/- සේවක සුභසාධන අතුරු දීමනාවක් ගෙවීම සුදුසු බවට නිර්දේශ කර ඇත.<br><br>සේවක සුභසාධන අතුරු දීමනාව ගෙවීමට නිර්දේශිත කමිටු වාර්තාව කළමනාකාරීත්ව මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර, අදල දීමනාව සම්බන්ධව වාර්තාවක් සකස් කර, එම වාර්තාව ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය නිර්දේශය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, කළමනාකාරීත්ව මණ්ඩලය විසින් වැඩිදුරටත් දන්වා සිටින ලදී. |
| 02 | | ගබඩා භාරකරු තනතුර කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයට අයත් MA 2-1 වැටුප් කාණ්ඩය යටතේ අන්තර්ග්‍රහණය කිරීම | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කරන ලද ඉල්ලීමකට අනුව සේවා අවශ්‍යතාවය සලකා ගබඩා භාරකරු තනතුරු 01 ක් පමණක් DMS/B2/42/2 අංක දරණ 2012-01-27 දිනැති ලිපිය මඟින් අනුමත කර ඇත. නමුත්, එම අවස්ථාවේදී ක්‍රීඩාංගණවල ගබඩා ස්ථාපිත කර තිබූ හෙයින් ගබඩා භාරකරුවන් තිදෙනෙක් සේවයේ යෙදී සිටින ලදී.<br><br>ඉහත අනුමැතිය යටතේ එක් සේවකයෙකු අන්තර්ග්‍රහණය සිදුකිරීමට නොහැකි හෙයින් තවත් අතිරේක තනතුරු 03ක් ඇති කිරීම සඳහා අනුමැතිය කිහිපවරක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2015-11-26 දිනැති ලිපිය මඟින් ගබඩා භාරකරු තනතුරු මුළු ගණන 03ක් ලෙස අනුමත කර දී ඇත.<br><br>දැනට ගබඩා භාරකරු තනතුර දරණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන (MA 1-1) සේවා ගණයට අයත් නිළධාරීන් තිදෙනා කළමනාකරණ සහකාර තාක්ෂණික (MA 2-1) සේවා ගණයෙහි අනුමත නව බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව 2012-01-27 වන දින සිට අන්තර්ග්‍රහණය කර එදින සිට හිඟ වැටුප් හා දීමනා ගෙවීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 03 | | විද්‍යුත් කාලගණක උපකරණ ක්‍රියා කිරීම - සුගතදාස ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණ | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාකයේ පවත්නා පිහිනුම් තරඟාවලි සඳහා විද්‍යුත් කාලගණක උපකරණ භාවිතයෙන් වේග නිර්ණය සිදුකිරීමට හා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ ජවන හා පිටිය ඉසව් පැවැත්වීමේදී කාල නිර්ණය හා දුර නිර්ණය කිරීමට විද්‍යුත් කාලගණක උපකරණ හා විද්‍යුත් මිනුම් උපකරණ භාවිතා කරමින් සේවා පහසුකම් සැපයීමට අප ආයතනයේ පුහුණු සේවක කණ්ඩායමක් සිටින අතර, සේවා දයකයින් ඉල්ලා සිටින අවස්ථාවලදී තරඟාවලි සඳහා එම පහසුකම ලබාදීම සිදුකරනු ලබයි.<br><br>ඉහත සඳහන් කර ඇති සේවා පහසුකම් ලබාදීම සඳහා මීට පෙර එම කාර්යය මණ්ඩලවල සේවය කරන අයවලුන්හට දිනකට රු1,000/- ක දීමනාවක් ලබාදුන් අතර, තමන්ට පවරා ඇති රාජකාරීන්ට අමතරව, ඉටුකරනු ලබන වෙනත් රාජකාරියක් මෙන්ම, මෙය විශේෂිත වෘත්තිය කටයුත්තක් බැවින් හා වර්තමානයේ පවතින ගමන් වියදම් හා ජීවන වියදම් තත්ත්වය මත එම දීමනාව දිනකට රු1,500/- ලෙස ගෙවීමට කළමනාකරු (ගෘහස්ථ) කරනු ලැබූ නිර්දේශය කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | | ඒ අනුව මෙම සේවාවන් ලබාගැනීම සඳහා ඉල්ලුම් කරනු ලබන බාහිර පාර්ශවයන්ගෙන් අයකර එක් අයෙකුට දිනකට රු.1,500/- ක දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී ඇත. |
| 04 | | ක්‍රියාකාරී අධ්‍යක්ෂක තනතුර ඇති කිරීම - සුජාක්‍රීසංඅ | මේ වනවිටත් ක්‍රියාකාරී අධ්‍යක්ෂක තනතුර ඇති කිරීම සඳහා 1999 අංක 17 දරණ සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා ලිඛිත ඉල්ලීමක් ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති අතර, සංශෝධනය සඳහා අවශ්‍ය කටයුතු දැනටමත් සිදුවෙමින් පවතින බවත් සඳහන් කරන ලදී.<br><br>ක්‍රියාකාරී අධ්‍යක්ෂ යන තනතුරෙහි අවශ්‍යතාවය සඳහන් කරමින් වාර්තාවක් සකස් කර ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය නිර්දේශය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට කටයුතු කරන ලෙස කළමනාකාරීත්ව මණ්ඩලය උපදෙස් දෙන ලදී.<br><br>එමෙන්ම, මේ අවස්ථාවේදීම පනතේ වෙනත් සංශෝධනයන් සිදුකිරීමට හා සේවක ව්‍යුහයේ සංශෝධනයන් සිදු කිරීමට ඇත්නම්, ඒ සියල්ලම සිදුකර ගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසත්, කළමනාකාරීත්ව මණ්ඩලය වැඩිදුරටත් උපදෙස් දෙන ලදී.<br><br>ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුර සේවා අවශ්‍යතාවය මත ඇති කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉටුකර ගන්නා තෙක්, එම තනතුර සඳහා කළමනාකාරීත්ව මණ්ඩල සාමාජික කේ ඒ ආලෝක ශ්‍රීකාන්ත මහතා මාස 06ක කාලසීමාවකට තාවකාලිකව පත්කිරීමට කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කරන ලදී. |
| 07 | | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ භූමියේ ඉදිකිරීමට යෝජිත ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන (SLADA) ගොඩනැගිල්ල | ජුඩෝ සංගමය විසින් ඉදිකර ඇති ගොඩනැගිල්ල ඇති සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් භූමි කොටසෙහි යෝජිත ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතන (SLADA) ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කර ඇති බවත්, ඒ සඳහා මුල්ගල් තැබීම ගරු ක්‍රීඩා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇති බවත් විධායක අධ්‍යක්ෂ, සුජාක්‍රීසංඅ විසින් දන්වා සිටින ලදී.<br><br>අදාල ගොඩනැගිල්ල ඉදිකිරීම 2014-08-26 දින පැවති කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණු අතර, මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන වෙන්කිරීම 2016 වර්ෂයේදී සිදුකර ඇති බැවින් මෙම ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කිරීමට එම ආයතනයේ නිළධාරීන් විසින් සැලසුම් කර ඇත.<br><br>නමුත්, සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට අයත් භූමියක මෙවැනි ආකාරයේ ඉදිකිරීමක් සඳහා එකඟවිය නොහැකි බව කළමනාකාරීත්ව මණ්ඩල සාමාජික / මහා භාණ්ඩාගාර නියෝජිත එස් ඩබ්ලිව් මදනායක මහතා විසින් දන්වා සිටින ලදී. එමෙන්ම, මෙවැනි ඉදිකිරීම් සිදුකිරීමේදී ප්‍රධාන සැලැස්මට (Mater Plan) අනුව සිදුකිරීම සුදුසු බව පෙන්වා දුන් අතර, අප ආයතනය විසින් ඉදිරියේදී සිදුකරනු ලබන ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘතියක ගොඩනැගිල්ලකින් කොටසක් හා රථවාහන නැවැත්වීමේ පහසුකම්ද සහිතව ලබාදීමට හැකියාවක් ඇත්දැයි සොයා බැලීම වැදගත් බවද කළමනාකාරීත්ව මණ්ඩලය විසින් පෙන්වා දෙන ලදී.<br><br>මෙම කරුණ සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය (SLADA) ක්‍රීඩා අමාත්‍යාංශය අනුබද්ධිත ආයතනයක් ලෙස පවත්වා ගෙන යන බැවින්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ (SLADA) හා ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම කාර්යාංශයේ (CECB) නිළධාරීන් සමඟ සාකච්ඡා කර අදාල ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා සුදුසු භූමියක් වෙන් කරවා දීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම කළයුතුයි යන්න කළමනාකාරීත්ව මණ්ඩලය තීරණය කළ හෙයින්, මේ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදී. |
| 08 | | “ඩී” රථගාලට යාබදව ඇති භූමියෙහි ඉදිකිරීමට යෝජිත තරු පන්තියේ හෝටලය | තරු පන්තියේ හෝටලය ඉදිකිරීමට යෝජිත භූමිය දැනට නාගරික සංවර්ධන අධිකාරියට අයත් වන අතර, මෙම භූමිය අප අධිකාරිය වෙත පැවරීමට කැමැත්ත පළ කර ඇති බැවින් අධිකාරියට ගැලපෙන ක්‍රමවේදයක් යටතේ නව හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම කාලෝචිත බව සඳහන් කරන ලදී. ඒ අනුව “ඩී” රථගාලට යාබද භූමියේ මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ හැකියාවක් ඇති බවත් සභාපති, සුජාක්‍රීසංඅ විසින් සඳහන් කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | | මෙවැනි ව්‍යාපෘතියක් තුළින් ආයතනයට ආදායමක් උපයා ගත හැකිවීම නිසා මෙම ව්‍යාපෘතිය සම්බන්ධව කරුණු සොයා බලා ඉදිරි කටයුතු සිදුකිරීමට අනුමැතිය දෙන ලදී. |
| 09 | 2016 අප්‍රේල් | LED දැන්වීම් පුවරුවේ දැන්වීම් ප්‍රචාරණය කිරීම සඳහා ගාස්තු අයකිරීම | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගණයේ වී ඒ සුගතදාස මහතාගේ පිළිරුව පිටුපසින් සිරිමාවෝ බණ්ඩාරනායක මාවතට මුහුණලා ස්ථාපිත කර ඇති 20'x10' LED පුවරුවෙහි ඉදිකිරීම් කටයුතු සියල්ල අවසන් කර සැපයුම්කාර ආයතනය විසින් 2016-01-20 වන දින අප ආයතනයට භාර දී ඇත.<br><br>වෙළඳ ප්‍රචාරණය සඳහා දැන්වීම් ලැබී ඇතත් අයකිරීම් ගාස්තු පිළිබඳව තීරණයක් ගෙන නොමැති හෙයින් ඒ සඳහා සේවාදායකයින්හට අවස්ථාව ලබාදීමට නොහැකිවී ඇති බැවි කළමනාකරු (තොරතුරු තාක්‍ෂණ) විසින් දන්වා සිටින අතර, තත්පර 20 ක කාලයක දැන්වීමක් වාර 100ක ප්‍රදර්ශනය කිරීමට මාසිකව රු 25,000/- (බදු රහිත) මුදලක් යටතේ වෙළඳ ප්‍රචාරණ කටයුතු සිදුකිරීමට නිර්දේශයන් ඉදිරිපත් කර ඇත.<br><br>LED පුවරුවෙහි දැන්වීම් පුවරු ප්‍රචාරණය සම්බන්ධව කළමනාකාරීත්ව මණ්ඩලය විසින් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලද අතර, පහත දක්වා ඇති කරුණු කෙරෙහි අවධානය යොමුකිරීම වැදගත් බවද දන්වා සිටින ලදී.<br><br>ප්‍රචාරණය සඳහා ලබාදෙන දැන්වීම් සියල්ල සභාපතිතුමාගේ දැනගැනීමට ඉදිරිපත් කළයුතු බවත්, ඒ සඳහා සභාපති, සුජාක්‍රීසංඅ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම.<br><br>දැන්වීම් ප්‍රචාරණය සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම.<br><br>අධිකාරියේ පහසුකම් ලබාගන්නා සේවා දායකයින්ගේ ඉසව් සහනදායි ක්‍රමවේදයක් හඳුන්වාදීම තුළින් ප්‍රචාරණය සඳහා අවස්ථා ලබාදීම.<br><br>පාරිසරික කටයුතු / අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දැන්වීම් ප්‍රචාරණය කිරීම.<br><br>සේවාදායකයින්ගේ දැන්වීම් ප්‍රචාරණය 90% ක්ද ආයතනයේ ප්‍රචාරණ අවශ්‍යතාවයන් සඳහා 10% සිදුකිරීම.<br><br>LED පුවරුව සඳහා සුදුසු රක්‍ෂණාවරනයක් ලබාගැනීමට කටයුතු කිරීම.<br><br>LED පුවරුවෙහි ආරක්‍ෂාව තහවුරු කිරීම / පසු ක්‍රියාකාරකම් නිරීක්‍ෂණය සඳහා CCTV කැමරා සවිකිරීම.<br><br>වෙළඳ දැන්වීම් ප්‍රචාරණය සඳහා කොළඹ මහ නගර සභාවේ අනුමැතියක් ලබාගත යුතු නම්, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම/ආයතනය ඇතුළතින් පිරිසක් තෝරාගෙන LED පුවරුවෙහි දැන්වීම් පුවරු ප්‍රචාරණය සඳහා අලෙවිකරණ කටයුතු සිදුකිරීමටද කළමනාකරු (තොරතුරු තාක්‍ෂණ) යෝජනා කර සිටි අතර, අදාල ප්‍රචාරණ කටයුතු ඉටුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී.<br><br>දැන්වීම් කාලය තත්පර 20 ක් වන දැන්වීමක් වාර 100ක් ප්‍රදර්ශණය කිරීමට මාසිකව රු 25,000/- (බදු රහිත) ගාස්තුවක් අයකර වෙළඳ ප්‍රචාරණ කටයුතු සිදුකිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| 10 | | ක්‍රීඩාංගණ වැඩි දියුණු කිරීම සඳහා යුද්ධ හමුද සහාය ලබාගැනීම | ක්‍රීඩා අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීමකට අනුව, ක්‍රීඩා පිටි නිසි අයුරින් පවත්වා ගෙනයාමේ පහසුව හා ක්‍රීඩාංගන වැඩි දියුණුකිරීම් රාජකාරි සඳහා පූර්ණකාලිනව මෙම අධිකාරිය වෙත සේවා දායකත්වය ලබාදීමට රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යාංශය මඟින් යුද්ධ හමුද නිළධාරීන් 03 දෙනෙකු හා සෙසු නිළයන් 10 දෙනෙකු අනුයුක්ත කර ඇත.<br><br>ඒ අනුව, ආයතනයේ සේවා අවශ්‍යතාවය මත ඉංජිනේරු ශිල්පිය සේවයට අයත් ලුතිනන් කර්නල් බී ඩී එල් කොළොන්නේ යුඑස්පී ක්‍රීඩාංගණවල ප්‍රධාන සම්බන්ධීකරණ නිළධාරි ලෙස පත්කිරීමටත්, |

| | | | |
|---|---|---|---|
| | | | අනෙකුත් නිළධාරීන් හා සෙසු නිළයන් ඉල්ලුම් කර ඇති පරිදි රාජකාරියෙහි යෙදවීමටත් කළමනාකාරීත්ව මණ්ඩලයේ එකඟතාවය පළකරන ලදී.<br><br>අදල නිළධාරීන් සඳහා රාජකාරීන් හා වගකීම් පැවරීම සිදුකරන ලෙස කළමනාකාරීත්ව මණ්ඩලය උපදෙස් දෙන ලද අතර, අනුයුක්ත කර ඇති නිළධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් හා දුරකථන පහසුකම් ලබාදීමටත් තිරණය විය. |
| 11 | | ආතර් ද සිල්වා මාවතට මුහුණලා ඇති වෙළඳසැල් පරිශ්‍රය බදුදීම | ආතර් ද සිල්වා මාවතට මුහුණලා ඇති වෙළඳ සැල් පරිශ්‍රය "ටටා ටේලරින්" ආයතනයට වසර 02ක කාලයකට මාසිකව රු100,000/- මුදලකට බදු දී ඇති අතර, එම බදුකාලය 2016-04-30 වන දිනෙන් අවසන්වේ.<br><br>අදල ආයතනයේ හිමිකරු විසින් නැවත එම වෙළඳ සැල් පරිශ්‍රය මාසික බදුකුලිය රු5,000/- කින් වැඩිකර, වසර 03 ක කාලයකට බදු කාලය දීර්ඝ කර දෙන ලෙස ඉල්ලීමක් කර ඇත. කරනු ලැබූ ඉල්ලීම කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ඡා කරන ලද අතර, නැවතත් එම වෙළඳ සැල් පරිශ්‍රය ටටා ටේලරින් ආයතනයටම ලබාදීමටත්, මාසික බදුකුලී මුදල 5% කින් වැඩිකිරීමේ පදනම මත වසර කාලයක් (වසර 01) සඳහා ලබාදීමටද අනුමැතිය දෙන ලදී. |
| 12 | 2016 මැයි | බෝගම්බර ක්‍රීඩාංගනයේ නඩත්තු අවශ්‍යතා සඳහා කුබෝටා වර්ගයේ අත් ට්‍රැක්ටරයක් මිලදී ගැනිම | ක්‍රීඩා පිටිය පිරිසිදු හා නඩත්තු කටයුතු කිරීමේදී ඉවතලන අපද්‍රව්‍ය ක්‍රීඩාංගනයෙන් ඉවත්කිරීම සඳහා කුබෝටා වර්ගයේ අත් ට්‍රැක්ටරයක් මිලදී ගැනිමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට හා මුදල් අමාත්‍යාංශයේ නිසි අනුමැතියන් ලබා ගැනිම සඳහා කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී.<br><br>තවද, මෙවැනි අවශ්‍යතාවයන් හඳුනාගෙන 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්වී තිබිය යුතු බවටද, කළමනාකාරීත්ව මණ්ඩලය විසින් දන්වා සිටින ලදී.<br><br>එමෙන්ම, බෝගම්බර ක්‍රීඩාංගණයේ දැනට පරිහරණය කරනු ලබන ට්‍රැක්ටරය භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ ඇති බැවින් රථය සම්බන්ධව වාර්තාවයක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පරීක්ෂක නිළධාරියෙකුගෙන් හා ජර්මන් කාර්මික අභ්‍යාස විද්‍යාලයෙන් ලබාගැනිමට කටයුතු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. |
| 13 | | උපදේශාත්මක සේවාව ලබාගැනිම - පාපන්දු ක්‍රීඩා පිටිය අළුත්වැඩියා කිරීම හා මීටර් 400 / 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම. | සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයේ පාපන්දු ක්‍රීඩා පිටිය අළුත්වැඩියා කිරීම හා මීටර් 400 / 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබාදීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇති බැවින්, ව්‍යාපෘතින්හි කාර්යයන් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව අධ්‍යක්ෂ, සුජාක්‍රීසංඅ විසින් කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලදී.<br><br>මීටර් 400 / 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම සඳහා මුල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම සිදුකර ඇති බැවින්, තාක්ෂණ ඇගයීම් කමිටු පත්කිරීම සඳහා සුදුසු නිළධාරීන් නම් කර ක්‍රීඩා අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශයට ලිඛිත ඉල්ලීමක් සිදුකළ යුතු බවට කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සාකච්ඡා කළ අතර, මෙහිදී ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් නම් කරනු ලබන නිළධාරීන් මේ සම්බන්ධව විශිෂ්ඨ දැනුමක් ඇති නිළධාරීන් වීම සුදුසු බවත්, ඉන් අනතුරුව අනෙකුත් සාමාජිකයින් පත්කිරීමට මුදල් අමාත්‍යාංශය වෙත යොමුකිරීම අවශ්‍ය බවත් සඳහන් කරන ලදී.<br><br>පාපන්දු ක්‍රීඩා පිටිය සකස් කිරීම ශ්‍රී ලංකා ගුවන් හමුදව මඟින් ඉටුකරවා ගැනිමට සැලසුම් කර ඇති බවත්, ඒ සඳහා ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමාගෙන් ලිඛිත ඉල්ලීමක් සිදුකර ඇති බව දන්වා සිටින ලදී. මීට අමතරව, කැබිනට් අනුමැතියක් මත ශ්‍රී ලංකා ගුවන් හමුද හට පිරිස් ලබාගැනිමටද කටයුතු කර ඇති බවත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු ඉටුවෙමින් පවතින බවත් සඳහන් කරන ලදී. කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනිමට ප්‍රථම ශ්‍රී ලංකා ගුවන් හමුදව විසින් මෙම ව්‍යාපෘතිය භාරගෙන කටයුතු කිරීමට එකඟතාවයක් ඇතිබවට දැනගැනිම වැදගත් බවද කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සඳහන් කරන ලදී.<br><br>උපදේශාත්මක සේවාව රාජ්‍ය අංශයේ ආයතනයක් වන ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙතින් |

| | | | |
|---|---|---|---|
| | | | ලබාගැනීමට සැලසුම් කර ඇති බවත්, දැනටමත් එම ආයතනය විසින් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කරමින් පවතින බවත් දැනුම් දෙන ලදී. ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය හරහා දේශීය / විදේශීය කොන්ත්‍රාත්කරුවන්ගෙන් උපදේශාත්මක සේවාව ලබාගැනීම සුදුසු බවත්, ඒ සඳහා කළමනාකාරීත්ව මණ්ඩලයේ එකඟතාවයද ප්‍රකාශ කරන ලදී. |
| 14 | | සුගතදස ක්‍රීඩා හෝටලයේ අළුත්වැඩියා හා නවීකරන කටයුතු සිදුකිරීම 2 වන අදියර | සුගතදස ක්‍රීඩා හෝටලයේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතුවල පළමු අදියර අමාත්‍ය මණ්ඩල තීරණ පත්‍රිකා අංක අමප/13/1114/503/085 අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) වෙතින් ඉටුකර ගෙන ඇත.<br><br>ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් මෙම ව්‍යාපෘතියේ 2 වන අදියර සඳහා දළ ඇස්තමේන්තු හා ලංසු ලේඛණයේ කෙටුම්පත ලබාදී ඇති බව තාක්ෂණික අංශය විසින් දන්වා ඇත.<br><br>නමුත්, අනුමත කර ඇති කැබිනට් තීරණයන් පදනම් කර 2015-01-08 වන දිනෙන් පසුව ආරම්භ කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති ඇත්නම් එම ව්‍යාපෘති සම්බන්ධව ආර්ථික කළමනාකරණය පිළිබඳ කැබිනට් කමිටුව වෙත වාර්තා කිරීම කළයුතු බව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති ලිපියකින් අමාත්‍යාංශ සියල්ල දැනුවත් කර ඇති බවත්, කළමනාකාරීත්ව මණ්ඩලය දන්වා සිටි අතර, මේ සම්බන්ධව කරුණු සොයා බලා, ඒ අනුව කටයුතු කිරීම වැදගත් බවද සඳහන් කරන ලදී.<br><br>ක්‍රීඩා හෝටලයේ පළමු අදියර ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගම (REDECO) මඟින් ඉටුකරවා ගෙන ඇති බැවින් එහි 2 වන අදියර එම කොන්ත්‍රාත්කරුගෙන්ම ඉටුකරවා ගැනීම සුදුසු බව අධ්‍යක්ෂ, සුජාක්‍රිසංඅ කළමනාකාරීත්ව මණ්ඩලය වෙත දන්වා සිටින ලද අතර, පළමු අදියරෙන් සම්පූර්ණ නොකරන ලද කාර්යයන් හෝ සමහරක් 2 වන අදියර සඳහා ඇතුළත් කර ඇති බවද වැඩිදුරටත් සඳහන් කරන ලදී.<br><br>මෙම කරුණ සම්බන්ධව කළමනාකාරීත්ව මණ්ඩලය දීර්ඝ ලෙස සාකච්ජා කිරීමෙන් අනතුරුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය මත හා අනුමත කැබිනට් මණ්ඩල පත්‍රිකා අනුමැතියට යටත්ව කටයුතු කිරීමට කළමණාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී. |
| 15 | | සුගතදස ක්‍රීඩා හෝටලයේ අළුත්වැඩියා හා නවීකරන කටයුතු සිදුකිරීම 3 වන අදියර | මෙම ව්‍යාපෘතියේ 2 වන අදියර සඳහා දළ ඇස්තමේන්තු හා ලංසු ලේඛණයේ කෙටුම්පත ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) විසින් අප ආයතනය වෙත ලබාදී ඇති බව තාක්ෂණික අංශය විසින් දන්වා ඇත.<br><br>එබැවින්, මෙම ව්‍යාපෘතියේ කාර්යයන් ඉටුකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු නිර්දේශය මත හා අංක අමප/13/1114/503/085 දරණ අනුමත කැබිනට් මණ්ඩල පත්‍රිකා අනුමැතියට යටත්ව කටයුතු කිරීමට කළමණාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී. |
| | 2016 ජුනි | සුගතදස එළිමහන් ක්‍රීඩාංගණයේ මීටර් 400 හා 200 කෘත්‍රිම ධාවන පථ හා පාපන්දු පිටිය නැවත සැකසීම | මීටර් 400 හා 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම සඳහා අදාල ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රීඩා අමාත්‍යාංශය විසින් සිදුකරමින් පවතින අතර, සකස් කරන ලද වැඩ හා කාල සැලසුම් වලට අනුව 2016-09-21 වන දින එයට අදාල ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු සූදානම් කර ඇත.<br><br>ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල රු මිලි 67 ක් වන බව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය මඟින් දන්වා ඇත. ක්‍රීඩා පිටිය නැවත සැකසීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුහුණු / තාක්ෂණික ශ්‍රමිකයින් ලබාදීමට එකඟවී ඇති අතර ඔවුන්ගේ සේවාව ක්‍රීඩා පිටිය සකස් කර එහි නඩත්තු කාල සීමාව අවසන් වනතෙක් එනම් මාස 06ක කාලයක් ලබා ගතයුතුවේ. පුහුණු / තාක්ෂණික ශ්‍රමිකයෙකු සඳහා දිනකට රු 1,200/00 ක මුදලක් ගෙවන ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉල්ලීමක් කර ඇත.<br><br>ක්‍රීඩා පිටිය සකස් කිරීම සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අධිකාරිය වෙතින් |

| | | | |
|---|---|---|---|
| | | | සිදුකර ගතයුතු බැවින්, ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමට ලේකම්, ක්‍රීඩා අමාත්‍යාංශයෙන්ද ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>පුහුණු ශ්‍රමිකයන්ගේ සහාය හා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීම වෙන් වෙන් වශයෙන් ලබාගැනීම සිදුකිරීමේදී අමුද්‍රව්‍ය ලබාදීම සිදුකරන විටදී ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමුකළ යුතු බවත්, නිවැරදි හා නියමිත ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ පමණක් ලබාගැනීමට කටයුතු කළයුතු බවත් දන්වා සිටින ලදී. එමෙන්ම ක්‍රීඩා පිටිය සැකසීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා අමුද්‍රව්‍ය ලබාගැනීමේදී ඒ සම්බන්ධව මනා දැනුමැති තාක්‍ෂණික කමිටුවක් ආයතනයෙන් හෝ බාහිරින් ලබා ගැනීම සුදුසු බවද සාකච්ඡා කරන ලදී.<br><br>ශ්‍රී ලංකාවේ ගුවන් හමුදාවේ පුහුණු ශ්‍රමය හා තාක්‍ෂණික සහාය ලබා ගැනීම වෙනුවෙන් දිනකට රු 1,200/- ක මුදලක් ගෙවීම සාධාරණ බැවින් ඒ සඳහා එකඟතාවය පළකල අතර, රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ උපදෙස් අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය විනිවිද භාවයකින් යුක්තව නිවැරදිව ඉටුකිරීමට හා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමටද තිරණය විය. |
| | 2016 ජුලි | LED දැන්වීම් පුවරුව ප්‍රතිපත්ති මාලාව | 2016-04-27 වන දින පැවති කළමනාකාරීත්ව මණ්ඩල රැස්වීමේදී ලබාදුන් උපදෙස් අනුව බෘ දැන්වීම් පුවරුව භාවිතයේදී ක්‍රියාත්මක කිරීමට උපදෙස් මාලාවක් කළමනාකරු (තොරතුරු තාක්‍ෂණ) විසින් සකස් කර ඇති අතර, එය කළමනාකාරීත්ව මණ්ඩලයේ දැන ගැනීම හා අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදී.<br><br>කළමනාකාරීත්ව මණ්ඩලය විසින් එම ප්‍රතිපත්ති මාලාව සාකච්ඡා කරන ලද අතර, පහත දක්වා ඇති සංශෝධනයන් සිදුකිරීමට උපදෙස් හා අනුමැතිය ලබාදෙන ලදී.<br><br>(1) දේශපාලන කරුණු ඇතුළත් කර සකස් කරන ලද දැන්වීම් ප්‍රචාරණය නොකිරීම.<br><br>(2) ප්‍රතිපත්ති මාලාවේ අඩංගු කර තිබූ "ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් අනුමත කරන දැන්වීම්ද සහනදායී මිලට ලබාදීම" යන වගන්තිය ප්‍රතිපත්ති මාලාවෙන් ඉවත් කිරීම.<br><br>(3) සියළුම දැන්වීම් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ සභාපතිතුමාගේ අනුමැතියෙන් ප්‍රදර්ශණය කෙරින. යන්න සඳහන් කරුණ ක්‍රියාත්මක නොකිරීමට හා ඒ සඳහා සභාපති, ක්‍රීඩා අමාත්‍යාංශයේ නිළධාරියෙක් හා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර, පළකිරීමට යෝජිත දැන්වීම් සම්බන්ධව සෑම සතියකම තෙවන සතියේ රැස්වී සාකච්ඡා කිරීමෙන් එකඟතාවයකට පැමිණීමෙන් පසු අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම.<br><br>(4) ක්‍රීඩාව සම්බන්ධ කර සකස් කරන ලද ආහාර පාන හා ඖෂධ සම්බන්ධ වෙළඳ දැන්වීම් ප්‍රචාරණය නොකිරීම.<br><br>ඉදිරිපත් කර තිබූ අනෙකුත් ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය ලබාදෙන ලදී. |
| | | සුභ සාධන කටයුතු | 2016-05-15 වන දිනය ආශ්‍රිත කාලසීමාව තුළදී අයහපත් කාලගුණික තත්වය හේතුවෙන් ආපද තත්වයට පත්වූ අධිකාරියේ සේවයේ නියුතු ආපද ප්‍රදේශයේ ස්ථිර පදිංචි නිළධාරීන් 20 දෙනෙකු සඳහා එක් අයෙකුට රු5,000.00 බැගින් වියළි සළාක බෙදා හැරීම වෙනුවෙන් රු100,000.00 මුදලක් වැය කර ඇත.<br><br>මෙම කරුණ සම්බන්ධව කළමනාකාරීත්ව මණ්ඩලය දීර්ඝ ලෙස සාකච්ඡා කළ අතර, නිකුත් කර ඇති චක්‍රලේඛයන්ට අනුව කටයුතු කිරීම සිදු කළයුතු බව දැනුම් දී ඇති බැවින්, ඒ පිළිබඳව අවධානය යොමුකිරීම වැදගත් බවද සඳහන් කරන ලදී.<br><br>නමුත්, මෙම අවස්ථාවේදී විද්‍යුත් මාධ්‍යය මඟින් ජනාධිපති කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලැබූ ඉල්ලීමට අනුව අධිකාරිය විසින් ප්‍රතිචාර දැක්වූ බැව් සහකාර අධ්‍යක්‍ෂ (පාලන) දන්වා සිටින ලදී. ඒ අනුව, ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කරන ලද විද්‍යුත් මාධ්‍යය විසින් කරනු ලැබූ ඉල්ලීම සාධාරණ හේතුවක් බැවින්, අදාල නිවේදනය සාක්‍ෂි |

<table>
<tr><td></td><td></td><td></td><td>ලෙස ලබාගැනීමට කටයුතු කරන ලෙස කළමණාකාරීත්ව මණ්ඩල විසින් දැනුම් දෙන ලදී. ඒ අනුව අදාල නිවේදනයට යටත්ව රු100,000.00 වියළි සහනාධාර ලබාදීමට වැයවූ මුදල සඳහා කළමනාකාරීත්ව මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා දීමට තිරණය විය.</td></tr>
<tr><td></td><td>2016 සැප්තැම්බර්</td><td>විශේෂ ආරධිත අමුත්තන් සඳහා වෙන් කරන ලද විවේක කාමර හා ආපනශාලා සඳහා ගාස්තු අයකිරීම</td><td>සුගතදස ගෘහස්ථ හා පිහිණුම් තටාකයේ ක්‍රීඩා ඉසව් හා විවිධ උත්සව පැවැත්වෙන අවස්ථාවලදී විශේෂ ආරාධිත අමුත්තන් සඳහා වෙන් කරන ලද කාමර හා ආපනශාලා ් ජ් 9ල 10 හා 11- සේවාදායකයින් වෙත ලබාදීම මේවනතෙක් සිදුකර ඇත්තේ ගාස්තු අය කිරීමක් නොමැතිවය.<br><br>ඉහත සඳහන් කර ඇති ස්ථානයන් සඳහා නව ගෘහ උපකරණ යොද ඇති බැවින් එම ස්ථාන සඳහා ක්‍රීඩා ඉසව්වක් / වෙනත් උත්සවයක් පවත්වන අවස්ථාවලදී පහත දක්වා ඇති ගාස්තු අය කිරීමට යෝජනා කර ඇති අතර, එම ගාස්තු කළමනාකාරීත්ව මණ්ඩලය විසින් සංශෝධනය කරන ලදී. එම සංශෝධිත ගාස්තු 2016-08-15 වන දින සිට අය කිරීමට කළමනාකාරීත්ව මණ්ඩල අනුමැතිය දෙන ලදී.<br><br>
<table>
<tr><th colspan="2">කාමර අංකය</th><th colspan="2">යෝජිත අයකිරීම් ගාස්තුව (බදු රහිත) රු ශත</th><th colspan="2">සංශෝධිත ගාස්තුව (බදු රහිත) රු ශත</th></tr>
<tr><th colspan="2"></th><th>වායු සමීකරණ පහසුකම රහිත</th><th>වායු සමීකරණ පහසුකම සහිත</th><th>වායු සමීකරණ පහසුකම රහිත</th><th>වායු සමීකරණ පහසුකම සහිත</th></tr>
<tr><td>01</td><td>විශේෂ ආරාධිත අමුත්තන්ගේ කාමරය (A - 9)</td><td>3,000.00</td><td>3,500.00</td><td>3,000.00</td><td>4,000.00</td></tr>
<tr><td>02</td><td>ආරාධිත අමුත්තන්ගේ ආපන ශාලාව (A - 10)</td><td>4,000.00</td><td>5,000.00</td><td>4,000.00</td><td>5,000.00</td></tr>
<tr><td>03</td><td>ආරාධිත අමුත්තන්ගේ ආපන ශාලා කාමරය (A - 11)</td><td>2,000.00</td><td>2,500.00</td><td>2,000.00</td><td>3,000.00</td></tr>
</table>
</td></tr>
<tr><td></td><td></td><td>සුගතදස ගෘහස්ථ හා එළිමහන් ක්‍රීඩාංගණයන්හි අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු හා සිදුකළයුතු නව ඉදිකිරීම් සම්බන්ධව</td><td>ඇතැම් ගොඩනැගිලිවල වතුර කාන්දුවීම්, අපවහන නල පද්ධතින් කාන්දුවීම්, කොන්ක්‍රීට් පිපිරුම්, යකඩ කොටස් දිරායාම් හා වැසිකිළි පද්ධති කල් ඉකුත්වීම් වැනි අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් සිදුකළ යුතු බව නිරීක්ෂණය වීමත්, ක්‍රීඩාවන්ට අවශ්‍ය නවීන තාක්ෂණික උපකරණ ස්ථාපනය කිරීම හා ක්‍රමවේදයන් සකස් කිරීම හා නූතන ක්‍රීඩා යටිතල පහසුකම් සඳහා අවශ්‍ය කරන ස්ථාන නවීන උපාංග ඇතුළත්කර ඉදි කිරීමටත් යෝජනා වී ඇත. එබැවින් අවශ්‍ය සැළසුම් හා උපදේශාත්මක සේවාව මොරටුව විශ්ව විද්‍යාලයෙන් ඉටුකරවා ගැනීමට හා උපදේශාත්මක සේවාව වෙනුවෙන් ගෙවිය යුතු මුදලක් ඇත්නම් එම මුදල ගෙවීමට මෙන්ම අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීමටත් කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී.</td></tr>
<tr><td></td><td></td><td>නුවරඑළිය තුරඟ තරඟ පිටියේ දෛනිකව දේශිය / විදේශිය සංචාරකයින් රැගෙන පැදවීම් කරනු ලබන පෝනි සතුන් ලියාපදිංචි කිරිම</td><td>2015-12-01 දින සහ 2016-03-01 වන දින කළමනාකාරීත්ව මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද කළමනාකාරීත්ව මණ්ඩල පත්‍රිකාවන්ට අනුව පෝනි සතුන්හට සාමාජික කාඩ්පතක් නිකුත් කිරීම සඳහා රු 1,000/- මුදලක් මාසිකව ලබාගැනීමට අනුමත විය.<br><br>මාසිකව රු1,000/- ක මුදලක් ගෙවීමට අකමැති බව දන්වා ලිඛිතව ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එම මුදල රු500/- ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බව ආයතනයේ කළමනාකාරීත්වය දැනුම් දීම ඇත. පෝනි සතුන් පැදවීම සම්බන්ධව දැනට පවතින තත්වය පිළිබඳව කළමනාකාරීත්ව මණ්ඩලය සාකච්ඡා කළ අතර, මාසික අයකිරීම් ගාස්තුව පහත හෙළීම සාධාරණ බවද තිරණය කරන ලදී.<br><br>2016-09-01 වන දින සිට එක් පෝනි සතෙකුහට මාසිකව රු500/- මුදලක් අයකර සාමාජික කාඩ්පතක් ලබාදීමට කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී.</td></tr>
<tr><td></td><td></td><td>1999 අංක දරණ සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය</td><td>සුගතදස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ පනත සංශෝධනය කිරීමට පත්කරනු ලැබූ කමිටුව විසින් සංශෝධනය කරන ලද පනතේ කෙටුම්පතක් ගරු ක්‍රීඩා අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කිරීමෙන්</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| | | පනත සංශෝධනය කිරීම | අනතුරුව එහි ඇතුළත් කර තිබූ ආයතනයේ යෝජිත නාමය වෙනස් නොකිරීමටත් නාමය තිබෙන අයුරින්ම එනම්, "සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය" ලෙස පවත්වා ගෙන යාමට හා එහි සඳහන් කර ඇති අනෙකුත් සංශෝධනයන් ඒ ලෙසින්ම ඉදිරිපත් කිරීමටත් ගරු ක්‍රීඩා අමාත්‍යතුමා අනුමැතිය දී ඇති බව කළමනාකාරීත්ව මණ්ඩලය දැනුම් දෙන ලදි. |
| | 2016 ඔක්තෝබර් | දකුණු ආසියානු පිහිනුම් තරඟාවලිය - 2016 | 2106 ඔක්තොම්බර් මස 18 වන දින පැවැත්වීමට සැළසුම් කර ඇති දකුණු ආසියානු පිහිනුම් තරඟාවලිය - 2016 සඳහා පහත දක්වා ඇති පහසුකම් හා අළුත්වැඩියා කටයුතු සිදුකර දෙන ලෙස ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය මඟින් ඉල්ලීමක් කර ඇති බැව් දන්වා සිටින ලදි.<br><br>(i) විද්‍යුත් කාලගණක පද්ධතියේ සේවා හා නඩත්තු කටයුතු සිදුකිරීම.<br>(ii) විද්‍යුත් කාලගණක පද්ධතියේ ප්‍රතිස්ථාපනය කළයුතු උපාංග (Hannes) මිලදී ගැනීමට කටයුතු කිරීම.<br>(iii) දිය කරණම් තටාකය සඳහා දැනට භාවිතා කරනු ලබන Spring Boards වසර 20කට වඩා පැරණි බැවින් Spring Boards - 02 ප්‍රතිස්ථාපනය කිරීම.<br>(iv) වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම හා පිහිනුම් තටාක පරිශ්‍රයේ තීන්ත අලේප කිරීම.<br><br>මෙම තරඟාවලිය සම්බන්ධව පෙර දැනුම්දීමක් ශ්‍රී ලංකා ජල ක්‍රීඩා සංගමය විසින් කර නොමැති බැවින් සිදුකළයුතු සේවා හා නඩත්තු කටයුතු, නව උපාංග මිලදී ගැනීම හා අළුත්වැඩියා / තීන්ත ආලේප කටයුතු සිදුකිරීමට මුල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම සිදුකර නොමැති බැවින් මෙම කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන අධිකාරියේ උපයා ගන්නා ලද ආදායමෙන් සිදුකිරීමට යෝජනාවී ඇත.<br><br>මෙම කාර්යයන් සඳහා වැය වන ඇස්තමේන්තුගත මුදල පහත දක්වා ඇති පරිදිවේ.<br><br>(i) කාලගණක පද්ධතියේ සේවා හා නඩත්තු කටයුතු - රු මිලි 0.350<br>(ii) නව Hannes මිලදී ගැනීම - රු මිලි 1.300<br>(iii) නව Spring Boards මිලදී ගැනීම - රු මිලි 5.000<br>(iv) වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා කිරීම හා පිහිනුම් තටාක පරිශ්‍රයේ තීන්ත ආලේප කිරීම - රු මිලි 5.000<br>**ඇස්තමේන්තුගත මුළු මුදල - රු මිලි 11.650**<br><br>දියකරණම් තටාකය සඳහා ප්‍රතිස්ථාපනය කළයුතු Spring Boards විදේශිය සැපයුම්කාර ආයතනයකින් සෘජුව මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා ඇති මුත්, අදාල උපාංගය ආනයනය කිරීමට කාලය |

| | | | |
|---|---|---|---|
| | | | ප්‍රමාණවත් නොවන හෙයින් දැනට තිබෙන උපාංග ඒ සඳහා පරිහරණය කිරීමට ප්‍රමාණවත් තත්වයේ පවතින නිසාත්, ජල ක්‍රීඩා සංගමයේ නිළධාරීන්ගේ උපදෙස් මත එම භාණ්ඩ ගෙන්වීම සිදු නොකිරීමට තීරණය විය. එබැවින් එම භාණ්ඩයන් 2017 වර්ෂයේදී මිලදී ගැනීම් කටයුතු සිදුකිරීමට යෝජනා විය.<br>Spring Boards සඳහා මූලය ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා 2017 වර්ෂයේ අයවැය වාර්තාවට ඇතුළත් කිරීමට කළමනාකාරීත්ව මණ්ඩලයේ අනුමැතිය දෙන ලදී. |
| | 2016 නොවැම්බර් | ආතර් ද සිල්වා මාවතට මුහුණලා ඇති කඩ කාමරය බදු දීම | මෙම අධිකාරියට අයත් ආතර් ද සිල්වා මාවතට මුහුණලා ඇති කඩ කාමර බදු දීම සඳහා කිහිපවරක් පුවත්පත් දැන්වීම් පළකර මිළ ගණන් කැඳවීම සිදුකළද ගැණුම්කරුවන් ඉදිරිපත් නොවීම නිසාවෙන් කඩ කාමර බදු දීමේ කාර්යය අසාර්ථක විය. එබැවින්, ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණයක් මත ප්‍රසිද්ධ ස්ථානවල දැන්වීම් අලවා දැනුවත් කිරීම තුළින්ද මිළ ගණන් කැඳවීම සිදුකරන ලදී.<br><br>එසේ කැඳවීම් සිදුකිරීමේදී එක් පුද්ගලයෙකු පමණක් ඉල්ලුම් කර ඇති අතර, ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාමට හා මාසික කුලී මුදල රු 40,000/- (බදු රහිත) ගෙවීමටත්, ආපසු ගෙවන තැන්පත් මුදල ලෙස රු 100,000/- ගෙවීමටත් වර්ෂ 03 ක හෝ 05 කාලයක් සඳහා කඩ කාමරය ලබාදෙන ලෙසත් ඉල්ලුම් කර ඇත. තවද, වර්ෂ 05 ක කාලයක් කුලියට ලබාදීම සිදුකළහොත් ටෙන්ඩර් කාලයෙන් පසු වසරක් පාසා 10% කුලී මුදලක් වැඩිකිරීමට එකඟවන බවත් සඳහන් කර ඇත.<br><br>කළමනාකාරීත්ව මණ්ඩලය අදාල කඩ කාමරය බදුදීම පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, අධිකාරියේ නාමයට හානිකර නොවෙන විශේෂ කොන්දේසි මාලාවක් යටතේ ගිවිසුම් අත්සන් කිරීම සිදුකර බදුදීමට කටයුතු කිරීම සුදුසු බව තීරණය විය. |

# 2016 වර්ෂය සදහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ විගණන කාර්යය

2016 විගණිත වර්ෂය සදහා විගණන විමසුම් 02ක් ඉදිරිපත් වී ඇති අතර, ඒ සදහා පිළිතුරු සපයා නොමැත. විගණන කමිටුව එම වර්ෂය සදහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 03ක් පැවැත්වීමට කටයුතු කර ඇත. ඒ අනුව,

01. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා 2016 වර්ෂයට අදාළ පිළිතුරු ලබාදී ඇති අතර, ඒවා ක්‍රියාවටද ලක්කර ඇත.

02. 2016 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා ගණන 23කි.

03. ක්‍රීඩා අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 04ක් සඳහා මෙම අධිකාරියේ ඊට අදාළ නිළධාරීන් සහභාගි වී ඇත.

# භාණ්ඩ සමීක්ෂණය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2016 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය සඳහා 2016.12.08 දින අනු කමිටු 10කින් සමන්විත භාණ්ඩ සමීක්ෂණ කමිටුව පත්කරන ලදී. රජයේ මුදල් රෙගුලාසි 756, 757 විධිවිධාන අනුව අවසන් කර ඇත. භාණ්ඩ අපහරණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

# වාර්ෂික ප්‍රසම්පාදනය

2016 මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ ක්‍රියාකාරකම් උදෙසා සිදුකරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පහත පරිදි වේ.

| අ.අ. | ප්‍රසම්පාදනය | මුදල (රු.) |
|---|---|---|
| 01 | සුගතදාස අධිකාරියේ ආරක්ෂක නිළධාරීන් හට නිළ ඇඳුම් මසා ගැනිම. | 678,004.00 |
| 02 | සුගතදාස අධිකාරියේ පිහිණුම් තටාකයන්ට අවශ්‍ය රසායන ද්‍රව්‍ය මිල දී ගැනිම. | 1,381,911.60 |
| 03 | සුගතදාස ජාතික ක්‍රිඩා සංකීර්ණ අධිකාරිය සඳහා වැටුප් හා පැමිණීමේ පිටවීමේ මෘදුකාංග මොඩියුල මිළදී ගැනිම. | 840,000.00 |
| 04 | පිහිණුම් තටාක සඳහා අවශ්‍ය රසායන ද්‍රව්‍ය මිළදී ගැනිම. | 1,006,250.00 |
| 05 | එළිමහන් ක්‍රීඩාංගනයේ ඕ රථගාලෙහි වැසිකිලි පද්ධතිය මාසික කුලී පදනම මත බදුදීම. | 62,000.00 |
| 06 | 2016 වසර සඳහා සුගතදාස අධිකාරියේ ගෘහස්ථ, එළිමහන් ක්‍රීඩාංගන සහ ක්‍රීඩා හෝටලයේ පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනිම. | 590,520.00 |
| 07 | 252-7017 රථය අලුත්වැඩියාව. | 683,905.00 |
| 08 | සුගතදාස අධිකාරියේ රග්බි/පාපන්දු ක්‍රීඩාපිටි අගුත්වැඩියාව වෙනුවෙන් අමුද්‍රව්‍ය මිළදී ගැනිම. | 13,855,496.91 |
| 09 | ක්‍රීඩා හෝටලය අලුත්වැඩියා කිරීම දෙවන අදියර. | 50,805,601.56 |
| 10 | සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පිහිණුම් තටාක පරිශ්‍රය පින්තාරු කිරීම. | 4,940,545.00 |
| 11 | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ රග්බි/පාපන්දු ක්‍රීඩාපිටි සැකැසීම වෙනුවෙන් හියුම් පයිප්ප මිළදී ගැනිම. | 852,689.28 |
| 12 | සුගතදාස අධිකාරියේ රග්බි/පාපන්දු ක්‍රීඩාපිටි අලුත්වැඩියාව වෙනුවෙන් 3/4 ගල් කියුබ් 260ක් මිළදී ගැනිම. | 2,104,759.80 |
| 13 | බෝගම්බර ක්‍රීඩාංගනය සඳහා පිරිසිදු කිරීමේ සේවාව ලබා ගැනිම. | 129,500.00 |
| 14 | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ රග්බි/පාපන්දු ක්‍රීඩාපිටි පිළිසකර කිරීම වෙනුවෙන් පීවීසී අයිතම මිළදී ගැනිම. | 2,784,656.00 |
| 15 | 2015 වසරේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගත් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වෙන්දේසි කිරීම - 2016 | 186,000.00 |
| 16 | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ රග්බි/පාපන්දු ක්‍රීඩාපිටි පිළිසකර කිරීම වෙනුවෙන් වැලි මිළදී ගැනිම. | 1,658,730.00 |
| 17 | සුගතදාස අධිකාරියේ ආරක්ෂක අංශයේ සේවයේ නියුතු නිළධාරීන්හට 2016 වසර සඳහා නිළ ඇඳුම් ලබා දීම. | 601,565.00 |
| 18 | සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය සඳහා ඩිජිටල් ලකුණු පුවරු 02ක් මිළදී ගැනිම. | 10,062,500.00 |
| 19 | සුගතදාස අධිකාරියේ එළිමහන් ක්‍රීඩාංගනයේ මීටර් 400 ධාවන පථය වටා ඇති ආරක්ෂිත වැට අලුත්වැඩියා කිරීම. | 13,214,056.44 |
| 20 | සුගතදාස රග්බි/පාපන්දු ක්‍රීඩාපිටි නඩත්තු කිරීමට අවශ්‍ය උපකරණ මිළදී ගැනිම. | 30,580,361.70 |

# සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය පහත සදහන් අංගවලින් සමන්විත වේ.

1. ගෘහස්ථ ක්‍රීඩාගාරය
2. උප ක්‍රීඩාගාර (බැඩ්මින්ටන්, ස්කොෂ් හා මේස පන්දු)
3. පිහිණුම් තටාක සංකීර්ණය
4. කායවර්ධන මධ්‍යස්ථානය
5. ක්‍රීඩා හෝටලය







15 වන ජාතික වුෂු ශූරතාවලිය - 2016

# ගෘහස්ථ ක්‍රීඩාගාරය

ගෘහස්ථ ක්‍රීඩාගාරය ආසන 5004කින් සැදුම්ලත් වායුසමීකරණය කළ ප්‍රේක්ෂකාගාරයකින් සමන්විත වන අතර, මෙහි ගෘහස්ථ ක්‍රීඩා පිටියෙහි පළල මීටර් 35ක් හා දිග මීටර් 40ක් වේ. මෙම ක්‍රීඩාගාරයේ පැසිපන්දු, බැඩ්මින්ටන්, දැල්පන්දු, ජූඩෝ, ජිම්නාස්ටික්, වොලිබෝල්, මේස පන්දු, බොක්සිං, කරාතේ, මල්ලවපොර ආදී ගෘහස්ථ ක්‍රීඩා තරග පැවැත්වීමට පහසුකම් සපයනු ලැබේ. මීට අමතරව විවිධ උත්සව, සම්මේලන, සංගීත සංදර්ශන, රාජ්‍ය උත්සව හා වැඩමුළු සඳහා පහසුකම් සපයනු ලැබේ.

දෙරණ ලිට්ල් ස්ටාර් සීසන් 08, සමස්ත ලංකා කරාටේ තරඟාවලිය, ජාතික ටයිකොන්ඩෝ ශූරතාවලිය 2016, ශ්‍රී ලංකා පාසල් ජිම්නාස්ටික් තරගාවලිය, රණවිරු රියල් ස්ටාර් මිෂන් 05, 15 වන ජාතික වුෂු ශූරතාවලිය මෙම වසරේ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ප්‍රධාන ක්‍රීඩාගාරයේදී පැවැත්විණ.

2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන් රු. 18,492,299.00 ක ආදායමක් උපදවා ඇත.





2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයේ පැවැති තරඟ/ ශුරතාවලි සහ වෙනත් උත්සව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| අ.අ. | ක්‍රියාකාරකම | ජාත්‍යන්තර | ජාතික | එකතුව |
|---|---|---|---|---|
| 01 | ජිම්නාස්ටික් තරඟ | - | 01 | 01 |
| 02 | කරාතේ තරඟ | 01 | 08 | 09 |
| 03 | සංගීත සංදර්ශන (මෙගා) | - | 01 | 01 |
| 04 | සංගීත සංදර්ශන (වෙළෙඳ නොවන) | - | 05 | 05 |
| 05 | වුෂු තරඟ | - | 01 | 01 |
| 06 | විභාග/ අධ්‍යාපනික වැඩසටහන් | 01 | - | 01 |
| 07 | සම්මාන උළෙල | - | 03 | 03 |
| 08 | සම්මේලන | - | 04 | 04 |
| 09 | ටයිකොන්ඩෝ තරඟ | - | 01 | 01 |
| 10 | රැස්වීම් (පිහිනුම් තටාක දේශන ශාලාව) | - | 05 | 05 |
| 11 | පුහුණුවීම් | - | 24 | 24 |
| **එකතුව** | | **02** | **53** | **55** |



මහජන සේවා එක්සත් හෙද සංගමයේ 47 වන සංවත්සරය - 2016

# උප ක්‍රීඩාගාරය

මෙම උප ක්‍රීඩාගාර බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි දෙකකින් හා ස්කොෂ් ක්‍රීඩාගාර හතරකින් සමන්විත වන අතර, ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් කටයුතු සඳහා පහසුකම් සපයයි.



බැඩ්මින්ටන් පිටිය



ස්කොෂ් පිටිය

# පිහිණුම් තටාක සංකීර්ණය

ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ සියලු පහසුකම් සහිත එකම පිහිණුම් තටාක සංකීර්ණය මෙම අධිකාරිය සතුව ඇති අතර, එය පහත දැක්වෙන අංගවලින් සමන්විත වේ.

1. ප්‍රධාන පිහිණුම් තටාකය
2. පුහුණුවීම් සඳහා උප පිහිණුම් තටාකය
3. කිමිදුම් තටාකය
4. ළමා පිහිණුම් තටාකය

මෙම පිහිණුම් සංකීර්ණය මඟින් පාසැල් පිහිණුම් තරඟ පැවැත්වීමේ සිට ජාත්‍යන්තර මට්ටමේ පිහිණුම් තරඟ පැවැත්වීම දක්වා අවශ්‍ය පහසුකම් සපයනු ලබන අතර, දිවා/ රාත්‍රී තරඟ සඳහා අධිබලැති විදුලි ආලෝක කුළුණු සහිත පහසුකම් සපයා ඇත. මීට අමතරව, පාසැල් ළමුන් සඳහා පිහිණුම් පාසලක්ද පවත්වාගෙන යන අතර, මෙමඟින් ඉමහත් සහනදායී මුදලකට, පිහිණුම් තටාකාංගන පහසුකම් නොමැති ළමුන් සඳහා ඉතාමත් සහනදායි මුදලකට පහසුකම් සැපයීමෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි.



2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා පිහිනුම් තටාකවල පැවැති තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව පිළිබඳ සාරාංශයන් පහත පරිදි වේ.

| | |
|---|---|
| පාසල් ළමුන් සඳහා පිහිනුම් සාමාජිකත්ව | 551 |
| වැඩිහිටියන් සඳහා පිහිනුම් සාමාජිකත්ව | 179 |
| පිහිනුම් තරඟ | 19 |
| කිමිදුම් තරඟ | 04 |
| ජලපන්දු තරඟ | 07 |
| පුහුණුවීම් | 426 |
| වෙළෙඳ රූගත කිරීම් | 01 |
| තෝරාගැනීමේ තරඟ | 01 |
| **එකතුව** | **1,118** |

**ඉහත තරඟ/ ශූරතාවලි/ පුහුණුවීම් සාමාජිකත්ව සැපයීමෙන් පිහිනුම් තටාකාංගනවලින් රු.9,607,734.00ක ආදායමක් උපදවා ඇත.**

# ගෘහස්ථ ක්‍රීඩාංගන කායවර්ධන මධ්‍යස්ථානය



මෙම ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කල යුගයේ සිට පවත්වාගෙන එනු ලබන කායවර්ධන මධ්‍යස්ථානයක් පවතින අතර, එම මධ්‍යස්ථානය 2013 වසරේදී නවීකරණය කොට ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිලදී ගනු ලැබිණ.

මෙම මධ්‍යස්ථානය මඟින් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම අනෙකුත් පාර්ශවයන්ටද සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක.

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කායවර්ධන මධ්‍යස්ථානයෙන් රු. 1,562,638.00ක ආදායමක් උපදවා ඇත.**

# ක්‍රීඩා හෝටලය

මෙම ක්‍රීඩා හෝටලය පහත අංගවලින් සමන්විත වේ.

| | |
|---|---|
| තනි කාමර | 06 |
| යුගල කාමර | 14 |
| වායුසමනය කළ යුගල කාමර | 04 |
| සමූහ කාමර | 18 |

සුගතදාස ක්‍රීඩා සංකීර්ණය ස්ථාපනය කළ යුගයේ සිට පවත්වාගෙන එනු ලබන මෙම ක්‍රීඩා හෝටලය කාමර 42කින් සහ 100 දෙනෙකුට ආසන්න ප්‍රමාණයකට රැස්විය හැකි කාමර පහසුකම්වලින්ද, ක්‍රීඩකයන්ට නවාතැන්ගත හැකි සමූහ කාමර පහසුකම්වලින්ද සමන්විත වේ. මෙම හෝටලය මඟින් කාමර සහසුකම් සැපයීමට අමතරව විවාහ මංගල උත්සව, රැස්වීම් හා වැඩමුළු සඳහා අවශ්‍ය පහසුකම්ද සපයනු ලබයි. ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ සුබසාධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් ඔවුන්ට සහ ජාතික ක්‍රීඩා සංගම් සඳහා සහනදායි පදනම මත මෙම හෝටලයේ පහසුකම් ලබා දෙනු ලැබේ.

ක්‍රීඩාංගනයේ අවශ්‍යතාවයන්ට බාධා නොවන පරිදි ඉඩකඩ පවතින අවස්ථාවන්වලදී සාමාන්‍ය ජනතාව සඳහා පහසුකම් ලබාදීම සිදු කරයි.



**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ක්‍රීඩා හෝටලයෙන් රු. 3,719,092.00 ක ආදායමක් උපයා ඇත.**

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගෘහස්ථ ක්‍රීඩාංගනයට අයත් ගෘහස්ථ ක්‍රීඩාගාරයෙන්, පිහිනුම් තටාකයෙන්, කායවර්ධන මධ්‍යස්ථානයෙන්, ක්‍රීඩා හෝටලයෙන්, බදු කුලි සහ වෙනත් ප්‍රභවයන්ගෙන් රු.39,613,131.00ක ආදායමක් උපදවා ඇත.**

**සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)**

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) | 2015 වසර සඳහා (රු.මි.) | | 2016 වසර සඳහා (රු.මි.) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ වහල සහ ලි පොලොව අලුත්වැඩියා කිරීම | 141.35 | - | - | 141.35 | 84.00 | සිවිලිම සහ වහලය සම්පූර්ණයි |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ටයිල් ඇතිරීම සහ Water Proofing කිරීම. | 33.65 | - | - | 33.65 | 28.43 | ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි |
| 03 | ක්‍රීඩා හෝටලය ප්‍රතිසංස්කරණය කිරීම. | 60.00 | - | - | 60.00 | 17.13 | ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි |

**සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ 2017 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති**

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2015 (රු.මිලියන) |
|---|---|---|
| 01 | ගෘහස්ථ ක්‍රීඩාගාරයේ වහල සහ ලි පොලොව අලුත්වැඩියා කිරීම. | 141.35 |
| 02 | ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ටයිල් ඇතිරීම සහ Water Proofing කිරීම. | 33.65 |
| 03 | ක්‍රීඩා හෝටලය ප්‍රතිසංස්කරණය කිරීම. (ඉතිරි කොටස) | 60.00 |

# එළිමහන් ක්‍රීඩාංගනය

දිවා සහ රාත්‍රී කාලවලදී ජවන හා පිටිය ක්‍රීඩා තරඟ පැවැත්වීමට හැකි ආකාරයට මෙම ක්‍රීඩාංගනය සකසා ඇත. මෙම ක්‍රීඩාංගනයේ එකවර ප්‍රේක්ෂකයින් 20,000 කට පමණ තරඟ නැරැඹිය හැකි ආකාරයට ක්‍රීඩාගාර පහසුකම් සපයා ඇත.

ක්‍රීඩාංගනයේ මීටර් 400 හා මීටර් 200 වශයෙන් කෘත්‍රිම ධාවන පථ 02ක් ඇත. මීට අමතරව මහල් තුනකින් යුත් මාධ්‍ය කුටියක්, අධිබලැති විදුලි ආලෝක පද්ධතියක් මඟින් රාත්‍රී ක්‍රීඩා තරඟ පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත. මෙම ක්‍රීඩා පිටියේ මළල ක්‍රීඩා, වොලිබෝල්, රගර්, පාපන්දු, පැසිපන්දු ක්‍රීඩා මෙන්ම විවිධ උත්සව සඳහාද පහසුකම් සපයනු ලැබේ.

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ හා උත්සව පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.**

| අ.අ. | ක්‍රියාකාරකම | ජාතික | ජාත්‍යන්තර | එකතුව |
|---|---|---|---|---|
| 1. | පාපන්දු තරඟ | 03 | - | 03 |
| 2. | ක්‍රීඩා උත්සව (පාසල් නිවාසාන්තර තරඟ) | 25 | - | 25 |
| 3. | ක්‍රීඩා උත්සව (මීටර් 200 ධාවන පථය) | 51 | - | 51 |
| 4. | මළල ක්‍රීඩා තරඟ | 01 | - | 01 |
| 5. | රගර් තරඟ | 17 | - | 17 |
| 6. | පුහුණුවීම් | 193 | - | 193 |
| 7. | ව්‍යායාම සඳහා ඇවිදීමේ සාමාජිකත්ව | 106 | - | 106 |
| 8. | දැල් පන්දු තරඟ | 01 | - | 01 |
| 9. | වෙනත් | 01 | - | 01 |
| **එකතුව** | | **398** | **-** | **398** |



**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ, උත්සව, ඩී රවිගාල, බදු කුළී හා වෙනත් ප්‍රභවයන් මගින් රු.23,694,335.00ක ආදායමක් උපදවා ඇත.**

**සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනය ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය (2016 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට)**

| | කාර්යය | ඇස්තමේන්තු වටිනාකම (රු.මිලියන) | 2015 වසර සඳහා (රු.මි.) | | 2016 වසර සඳහා (රු.මි.) | | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රතිපාදන | වියදම | ප්‍රතිපාදන | වියදම | |
| 01 | පාපන්දු පිටියෙහි අලුත්වැඩියා කටයුතු/ විදයුත් ලකුණු පුවරුව ස්ථාපනය කිරීම/ ආරක්ෂක වැට සහ ඇතුළු වීමේ ගේට්ටුව සහ ආරක්ෂිත වැට ඉදි කිරීම. | 100.00 | - | - | 100.00 | 28.00 | ව්‍යාපෘතිය ක්‍රියාත්මකයි. |
| 02 | මීටර් 400, මීටර් 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම. | 500.00 | - | - | 500.00 | 0.12 | ටී.ඊ.සී වාර්තාව බලාපොරොත්තුවෙන් සිටී. |

**සුගතදාස එළිමහන් ක්‍රීඩාංගනයේ 2017 වර්ෂය සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති**

| | ව්‍යාපෘතිය | අයවැය ප්‍රතිපාදන 2015 (රු.මිලියන) |
|---|---|---|
| 01 | පාපන්දු පිටියෙහි අලුත්වැඩියා කටයුතු | 73.23 |
| 02 | ආරක්ෂක වැට සහ ඇතුළු වීමේ ගේට්ටුව සහ ආරක්ෂිත වැට ඉදි කිරීම. | 15.20 |
| 03 | විදුයුත් ලකුණු පුවරුව ස්ථාපනය කිරීම | 11.57 |
| 04 | මීටර් 400, මීටර් 200 කෘත්‍රිම ධාවන පථ නැවත ඇතිරීම. | 500.00 |

# ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය

ආර්.ප්‍රේමදාස ක්‍රිකට් ක්‍රීඩාංගනය අප රට සතු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ක්‍රිකට් තරඟ පැවැත්වීමට අවැසි සියලු පහසුකම්වලින් සමන්විත එක් ක්‍රීඩාංගනයකි. මෙහි එකවර ප්‍රේක්ෂකයින් 35,000කට පමණ තරඟ නැරැඹීමේ පහසුකම් ඇති අතර, විශාල රථ ගාලකින්ද යුක්ත වේ. මෙම ක්‍රීඩාංගනය 2006-05-10 දින ගනු ලැබූ කැබිනට් මණ්ඩල තිරණයක් අනුව 2006-11-01 දින සිට වසර තිහක කාලයක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට මසකට රු. 250,000/- ක මුදලකට බදු දී ඇත. ඒ අනුව, 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනය මගින් රු. 3,500,000.00ක ආදායමක් උපදවා ඇත.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ප්‍රධානතම ආදායම් මාර්ගයක්ව පැවැති මෙම ක්‍රීඩාංගනය දීර්ඝ කාලීනව මාසික නොවෙනස් බදු කුළියක් සහිතව බදුදීම මෙම අධිකාරියේ ආදායම පහත වැටීමට බලපා ඇත.



# බෝගම්බර එළිමහන් ක්‍රීඩාංගනය

මෙම ක්‍රීඩාංගනය මහනුවර නගර සභාව විසින් පාලනය කරන ලද අතර, 1999 සිට අප අධිකාරිය මඟින් පාලනය කරනු ලැබේ. මෙම එළිමහන් ක්‍රීඩාංගනය තුළ එකවර ප්‍රේක්ෂකයින් 10,000කට පමණ තරග නැරැඹිය හැකි ආකාරයේ ක්‍රීඩාගාර පහසුකම් ඇත. මෙහි මළල ක්‍රීඩා, පාපන්දු, රගර්, වොලිබෝල්, දැල්පන්දු, පාසැල් ක්‍රීඩා උත්සව හා වෙනත් උත්සව සඳහා පහසුකම් ඇත.

මෙම ක්‍රීඩාංගනය සඳහා නව කායවර්ධන මධ්‍යස්ථානයක් ඉදි කර ඒ සඳහා නවීන කායවර්ධන උපකරණද මිදී ගනු ලැබූ අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මෙන්ම වෙනත් පාර්ශවයන්හටද මෙහි සාමාජිකත්වය ලබාගෙන අවශ්‍ය පහසුකම් ලබාගත හැක.



ප්‍රසිද්ධ සංගීත සංදර්ශන ආදියට එළිමහන් රථගාල භාවිත කිරීම සඳහා ඉඩකඩ ලබා දුනහොත් ආදායම ඉහළ නැංවිය හැකි වුවත් ක්‍රීඩාංගනයේ තිබෙන ක්‍රීඩා පහසුකම්වලට හානි සිදුවිය හැකි බැවින් එසේ සිදු කරනු නොලැබේ.

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත් වූ තරඟ හා උත්සව, රථ ගාලෙන්, කායවර්ධන මධ්‍යස්ථානය මඟින් හා වෙනත් ප්‍රභවයන්ගෙන් රු.10,212,743.00ක ආදායමක් උපදවා ඇත.**

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මෙම ක්‍රීඩාංගනයේ පැවැත්වූ තරඟ/ ශූරතාවලි හා උත්සව පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.**



| | |
|---|---|
| **පාසල් මලල ක්‍රීඩා** | - 57 |
| **මලල ක්‍රීඩා** | - 25 |
| **පාපන්දු තරඟ** | - 32 |
| **රගර් තරඟ** | - 24 |
| **පුහුණුවීම්** | - 471 |
| **වෙනත්** | - 03 |

# බෙලිඅත්ත හා වීරකැටිය පිහිණුම් තටාක

**මෙම පිහිණුම් තටාක පහත අංගවලින් සමන්විත වේ.**

**බෙලිඅත්ත**

1. මංතීරු 08ක් සහිත මීටර් 50ක් දිගැති පිහිණුම් තටාකය
11. කිමිදුම් තටාකය

**වීරකැටිය**

1. මංතීරු 08ක් සහිත මීටර් 25ක් දිගැති පිහිණුම් තටාකය



බෙලිඅත්ත කිමිඳුම් තටාකය



බෙලිඅත්ත ප්‍රධාන පිහිණුම් තටාකය



වීරකැටිය පිහිණුම් තටාකය

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විද්‍යාලයේ පිහිණුම් තටාකවල පරිපාලනය හා නඩත්තු කටයුතු පමණක් 2008-08-07 දින සිට සුගතදාස අධිකාරිය විසින් සිදු කරනු ලැබුවත් මෙම පිහිණුම් තටාකවල අයිතිය සුගතදාස අධිකාරිය සතු නොවේ. අවට ප්‍රදේශවල වැඩිහිටියන් හා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට පිහිණුම් කටයුතු සඳහා පහසුකම් සැපයීම සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් සිදු කරනු ලබයි.

මෙම පිහිණුම් තටාකවල 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා මුළු ආදායම **රු.737,833.00ක්** වේ. මෙම පිහිණුම් තටාක දෙක පිළිබඳව වැඩිහිටියන්, පාසැල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ක්‍රීඩා සමාජ දැනුවත් කළද සහභාගිත්වය ඉතාමත් අඩු බැවින් ඉහළ ආදායමක් අපේක්ෂා කළ නොහැක.

තවද, වීරකැටිය පිහිනුම් තටාකය පිහිටා ඇත්තේ වීරකැටිය මධ්‍ය විද්‍යාල භූමිය තුළය. ඒ අනුව, පිහිණුම් තටාකයට ප්‍රවේශයද විදුහලේ ප්‍රධාන දොරටුවෙන් සිදුවන බැවින්, පිහිණුම් තටාකය ඌන උපයෝජනයකට පත්ව ඇත. මෙම පිහිණුම් තටාකවල නඩත්තු කටයුතු සඳහා දරන වියදමට සාපේක්ෂව ආදායමක් නොලබන බවද සඳහන් කළ යුතුය.

# නුවරඑළිය තුරඟ තරඟ පිටිය

2011-09-07 දින ක්‍රීඩා අමාත්‍යාංශය විසින් නුවරඑළිය තුරඟ තරඟ පිටියේ කළමනාකාරීත්වය සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට පවැන ලදී.






භූමි ප්‍රමාණය හෙක්ටයාර 34,564ක් වූ මෙම තුරඟ තරඟ පිටියෙන් 2016 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා අශ්ව ගාල්වලින්, බදුකුළී, අශ්ව/ පෝනි ඇවිදීම වෙනුවෙන් සියයට 10ක කුළී, උත්සව සමය සඳහා භූමිය කුළී පදනම මත ලබා දීම හා රථ වාහන නවතා තැබීමේ කුළී යන ප්‍රභව මඟින් රු.4,491,046.00ක ආදායමක් උපයා ගනු ලැබිය.

# ආයතනයේ සමස්ථ ප්‍රගතිය

2016 වර්ෂයේ අධිකාරියේ ක්ෂය හා පාරිතෝෂික වෙන්කිරීම සමඟ මෙහෙයුම් වියදම රු.363,345,451.00කි. මින් රු.89,648,834.00ක මුදලක් ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන්කිරීමක් වේ.

2016 වර්ෂය සඳහා අධිකාරිය මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු.175,250,000.00 ක් හා වර්තන ප්‍රතිපාදන ලෙස රු.160,800,000.00ක මුදලක් ලබාගෙන ඇත.

2016 වර්ෂයේ අධිකාරිය උපයා ඇති ආදායම රු.82,516,046.00ක් වන අතර, එය 2015 වර්ෂයට වඩා රු.17,105,399.00ක අඩුවීමකි.

2016 වර්ෂයේ වියදම 2015 වර්ෂයට වඩා වැඩිවීමට වැටුප් හා දීමනා රු.22,505,328.00ක් ලෙස වැඩිවීම ප්‍රධාන ලෙස බලපා ඇත.

2016 වර්ෂයේ අධිකාරිය උපයා ඇති ආදායම රු.82,516,046.00ක් වූ අතර, ක්ෂය වෙන්කිරීම් සමඟ මුළු වියදම රු.363,345,451.00ක් විය.

### 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආයතනය විසින් උපයා ඇති ආදායම් පහත පරිදි විචලනය වී ඇත.

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් | 54.78 | 57.85 | 61.60 | 69.00 | 77.17 | 89.03 | 134.61 | 99.62 | 82.51 |

### ආයතනයේ මුළු ණය

2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා තිබූ ණය තත්ත්වය පහත ආකාරයට විචලනය වී ඇත.

| වර්ෂය | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ණය | 2.30 | 4.61 | 133.03 | 42.95 | 42.04 | 41.00 | 45.00 | 44.00 | 43.70 |

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

# ගිණුම්කරණ ප්‍රතිපත්ති 2016

## 01. සාමාන්‍ය

### 1.1 අනුකූලවීමේ ප්‍රකාශය

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

### 1.2 පිළියෙල කිරීමේ පදනම

මූලය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර ඉඩම් ගොඩනැගිලි සහ යන්ත්‍ර සූත්‍ර ප්‍රත්‍යාගණනය සඳහා වූ ගැලපිලි කිරීම්වල දක්වා ඇත. මෙහිදී උද්ධමන තත්ත්වයන් සැලකිල්ලට ගෙන නොමැත.

### 1.3 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලුම ප්‍රමාණාත්මක බලපෑම් තිබේනම් ඒ සඳහා මූල්‍ය වාර්තාවල අවශ්‍ය ගැලපීම් සිදුකර ඇති අතර එම ගැලපීම් ගිණුම්වල හෙළිදරව් කර ඇත.

## 02. වත්කම් සහ ඒවා අගය කිරීමේ පදනම

ශේෂපත්‍රයෙහි පෙන්නුම් කරන වත්කම්වලින් ජංගම වත්කම් ලෙස හඳුනාගෙන ඇත්තේ මුදල් සහ බැංකු ශේෂයන් සහ සාමාන්‍ය ගණුදෙනු ක්‍රියාවලිය තුළදී වසරක් තුල මුදල් බවට පරිවර්තනය විය හැකි යැයි සැලකෙන අයිතම වේ.

### 2.1 වත්කම්

දේපල , පිරියත හා යන්ත්‍ර උපකරණ යන වත්කම්වල අගය පෙන්වා ඇත්තේ සමුච්චිත ක්ෂය අඩුකල පසු අගයටය.

ගොඩනැගිලි වත්කම්වල අඩංගු වන පිරිවැය වන්නේ ද්‍රව්‍ය හා සෘජු ශ්‍රම පිරිවැයයි. එසේම ස්ථාවර වත්කම් ප්‍රධාන උප අංගවලට වෙන්කර ඇත්තේ ඒවායේ ප්‍රයෝජනයට ගනු ලැබූ කාලය සලකා බලාය.

**<u>ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය</u>**

ආර් ප්‍රේමදාස ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණය 2006-11-01 දින සිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් මසකට රු. 250,000/- අයකිරීම් පදනම මත වසර 30ක කාලයකට බදු පදනම යටතේ ලබාදී ඇත. 2006-12-31 වන දින වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මඟින් ඉදිකරන ලද ගොඩනැගිල්ල සඳහා සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියට රු.25,753,844.64 මුදලක් අයවිය යුතුව තිබෙන අතර ඒ පිළිබඳව හා වර්තමානයේ අයකරනු ලබන මාසික කුලිය පිළිබඳව දෙපාර්ශවය අතර එකඟතාවයට පැමිණීමට බලාපොරොත්තු වේ.

**<u>බෙලිඅත්ත හා වීරකැටිය පිහිනුම් තටාක සංකීර්ණය</u>**

බෙලිඅත්ත කාර්මික විදුහලේ හා වීරකැටිය රාජපක්ෂ මධ්‍ය මහා විදුහලට අයත්ව තිබූ පිහිනුම් තටාක දෙක සහ කිමිදුම් තටාකය 2008 වසරේ අගෝස්තු 07 දින සිට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය විසින් නඩත්තු කටයුතු සිදුකරනු ලබයි. අධිකාරියේ කළමනානාකරණ අනුමැතිය මත සේවකයින් දස (10) දෙනෙක් තාවකාලික පදනම මත අනුයුක්ත කර ඇත.

2008 වසරේ මෙම පිහිනුම් තටාකවල වියදම් ගෘහස්ථ ක්‍රීඩාංගණයේ වියදම් ලෙෂ ගිණුම් ගත කලද කළමනාකරණ මණ්ඩල තිරන මත 2009 වසරේ සිට මෙම පිහිනුම් තටාකවල වියදම් වෙනම ගිණුම්වල දැක්වේ.

### 2.2 අනෙකුත් වියදම්

දේපල පිරියත හා උපකරණ තුල අඩංගු කොටස් නැවත ස්ථාපිත කිරීම සඳහා දරණ ලද වියදම් වෙනම ගිණුම්ගත කර ඇති අතර ඒවා ප්‍රාග්ධනික කර ප්‍රයෝජනවත් ආයුකාලය තුල ලියාහැරීම සඳහා ගිණුම්ගත කර ඇත. අනෙකුත් වියදම් ප්‍රාග්ධනිත කර ඇත්තේ එම වියදම් මගින් වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාබවල වර්ධනයක් සිදුවන වියදම් වන අතර අනෙකුත් සියලුම වියදම් ආදායම් ප්‍රකාශනයට ගලපා ඇත.

**2.3 ක්ෂයවීම්**

ක්ෂය ප්‍රතිපත්තිය ලෙස සරල මාර්ග ක්‍රමය අනුගමනය කරනු ලබන අතර වත්කම්වල ක්ෂයවීම් සිදුකරන්නේ වත්කම් මිලදී ගත් වර්ෂයේ හෝ ඉදිකිරීම් සම්පූර්න කල වසරේ සිටය. ක්ෂය අපේක්ෂිත ආයුකාලය තුල ආදායම් වියදම් ගිණුමට ලියා හැර ඇත. ඉඩම් සඳහා ක්ෂයවීම් සිදුකර නොමැත.

| | |
|---|---|
| ➢ ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2.5% |
| ➢ අධිබලැති විදුලි කුලුණු | 10% |
| ➢ කෘතිම ධාවන පථය | 20% |
| ➢ යන්ත්‍ර හා උපකරණ | 10% |
| ➢ පරිගණක | 25% |
| ➢ මෝටර් රථ | 20% |
| ➢ ක්‍රීඩා උපකරණ | 10% |
| ➢ ලී බඩු හා උපකරණ | 10% |
| ➢ කාර්යාලීය උපකරණ | 10% |
| ➢ තිරරෙදි | 50% |
| ➢ අධිබලැති විදුලි බල්බ සහ පිවලකය (ඉග්නයිටර්) | 33 1/3% |

32-5811 දරණ පැජරෝ රථය මිනිස්බල හා යෙදවුම් අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදාල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාශයේ දක්වා ඇත.

64-3180 දරණ පැජරෝ රථය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති හෙයින් අප අධිකාරියේ වත්කමක් ලෙස සැලකිය නොහැක. ඊට අදාල නඩත්තු හා අනෙකුත් වියදම් අධිකාරියේ ආදායම් වියදම් ප්‍රකාහයේ දක්වා ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.9,100,000ක් වටිනා NB-1527 අංක දරන නව වෑන් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.7,500,000ක් වටිනා PD-9713 අංක දරන නව කැබ් රථය ලබාදී ඇත. එම වාහනයේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

ජාතික අයවැය චක්‍රලේඛ 150ට අනුව මහා භාණ්ඩාගාරයෙන් රු.210,267.86ක් වටිනා BBG-3006 අංක දරන නව යතුරු පැදිය ලබාදී ඇත. එම යතුරු පැදියේ වටිනාකම ලෙස රක්ෂිත වටිනාකම ගිණුම්ගත කර ඇත.

**2.4 වෙළඳ හා අනෙකුත් ණය ගැනිම්**

වෙළඳ හා අනෙකුත් ණය ගැනිම් මූල්‍ය ප්‍රකාශවල දක්වා ඇත්තේ ඒවායේ ශුද්ධ උපලබ්දිත අගය මතය.

**2.5 තොග**

තොග මූල්‍ය වාර්තාවල දක්වා ඇත්තේ පිරිවැයටය. තොග වටිනාකම්වල ප්‍රථම ලැබුම්, ප්‍රථම නිකුතු ක්‍රමය මත තිරණය කරන අතර එයට මිලදී ගැනුම් පිරිවැය හා තොග වර්තමාන තත්ත්වය හා අදාල ස්ථානයට ගෙනෙන තෙක් දරණ සියලුම වියදම්වලට අදාල වේ.

**03. වෙන්කිරීම් හා වගකීම්**

මූල්‍ය වාර්තා පිළියෙල කිරිමේදී හඳුනා ගන්නා ලද සියලුම වගකීම් ගිණුම්ගත කර ඇත. මූල්‍ය වාර්තාවල ජංගම වගකීම් ලෙස හඳුනාගෙන ඇත්තේ ශේෂපත්‍ර දින සිට වසරක් තුල ගෙවා නිමකල යුතු හෝ ඉල්ලුවිට ගෙවිය යුතු වගකීම් වේ. ජංගම නොවන වගකීම් යනු වසරකට වඩා වැඩි කාලයක් තුලදී ගෙවා නිමකල යුතු වගකීම් ය.

**3.1 සේවක හිමිකම්**

සේවක අර්ථසාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල කරන ලද දායකත්වයන් මූල්‍ය වාර්තාවල වියදම් ලෙස හඳුනාගෙන ඇත.

**3.2 වෙළඳ හා අනෙකුත් ගෙවීම්**

වෙළඳ හා අනෙකුත් ගෙවීම් ඒවායෙහි පිරිවැය මත මූල්‍ය වාර්තාවල දක්වා ඇත.

**3.3 සේවක විශ්‍රාම පාරිතෝෂික**

පාරිතෝෂික සඳහා මූල්‍ය වාර්තාවල වෙන්කිරීම් සිදුකර ඇති අතර ප්‍රථම සේවා වර්ෂයේ සිටම සෑම සේවකයෙක්ම මෙම වෙන්කිරීම් සඳහා සලකා ඇත. මෙය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16ට අනුකූල වන ලෙස සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවීම් සිදුකරනු ලබන්නේ 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත අනුව හිමිකම් ලබා අඛණ්ඩ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කල සේවකයන්ට පමණි.

**04. ආදායම් ප්‍රකාශය**

**4.1 ආදායම්**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 29 අනුව අදාල සේවාවන් සැපයීමෙන් පසු උපචිත පදනම මත ආදායම් හඳුනාගෙන ඇත.

**4.2 වියදම්**

ආදායම් විස්තරයේ ලාභය හෝ අලාභය හඳුනාගෙන ඇත්තේ බදුවලට පෙර හා සියලුම හඳුනාගත් වගකීම් සඳහා වෙන්කිරීම් කිරීමෙන් පසුය.

ශුද්ධ හිඟය ගණනය කිරීමේදී වත්කම් නඩත්තු කිරීමේ සහ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරණ ලද වියදම් ආදායම් විස්තරයට ගලපා ඇත.

ආයතනයේ පහසුකම් ලබාදී ඇති නිලධාරීන් සහ සේවකයිනීගෙන් දුරකථන, විදුලි, ජල බිල්පත් සහ කුලී අයකරනු ලබන අතර අදාල වියදම් තිරු තුල පෙන්වා ඇත.

**මූල්‍ය වියදම්**

ස්ථාවර තැන්පතුවල පොලී ආදායම උපචිත ක්‍රමයට ගිණුම්ගත කර ඇත. පොලී වියදම් සහ අනෙකුත් ණය වියදම්, මුලයය වියදම් ගණනය කිරීමේදී ගලපා ඇත.

**දීමනා**

ප්‍රදාන හා ආධාර ඊට අදාල වියදම්වලට සරිලන පරිදි ගලපා ඇත. වත්කම්වලට අදාල මූල්‍යමය නොවන ප්‍රදාන එහි මූල්‍ය වටිනාකමට ගිණුම්ගත කර ඇති අතර එම වත්කම් ප්‍රයෝජනවත් ආයුකාලය තුලදී ආදායම් ප්‍රකාශයට ලියාහරිනු ලැබේ.

**05. මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**5.1 මුදල්**

මුදල් යනුවෙන් හඳුන්වා ඇත්තේ අත ඉතිරි මුදල් සහ ඉතා ඉහල ද්‍රව ශීලතාවයක් සහිතව මුදල් බවට පරිවර්තනය කළහැකි එසේ පරිවර්තනය කිරීමේදී කිසිදු අවධානමක් රහිත වත්කම් වේ. මේ සඳහා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් යනු, ඇතැති මුදල් හා බැංකු මුදල් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත්තේ වක්‍ර ක්‍රමය පදනම් කරගෙනය.

**06. ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්**

ශේෂපත්‍ර දිනට පසු වූ ප්‍රමාණාත්මක සිදුවීම් සියල්ල සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය ගැලපීම් ගිණුම් මගින් හෙලිදරව් කර ඇත.

## සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය

1. ආදායම් වියදම් ප්‍රකාශය
2. ශේෂ පත්‍රය
3. අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

# ආදායම් වියදම් ප්‍රකාශය

**2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය**

| | 2016.12.31 (රුපියල්) | 2015.12.31 (රුපියල්) |
|---|---|---|
| **ආදායම** | 82,516,046 | 99,621,445 |
| | **82,516,046** | **99,621,445** |
| | | |
| රජයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන | 160,800,000 | 131,750,000 |
| | | |
| | **160,800,000** | **131,750,000** |
| | | |
| මුළු ආදායම | **243,316,046** | **231,371,445** |
| | | |
| **වියදම්** | | |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක වේතන වියදම් | (178,806,207) | (156,284,285) |
| කළමනාකාරිත්ව මණ්ඩලයේ දීමනා හා වියදම් | (799,500) | (359,500) |
| පාරිතෝෂික වෙන්කිරීම් | (22,539,050) | (4,224,894) |
| ක්ෂයවීම් | (89,648,834) | (89,841,680) |
| අනෙකුත් වියදම් | (71,551,859) | (48,505,958) |
| | **(363,345,451)** | **(332,114,666)** |
| | | |
| මෙහෙයුම් අතිරික්තය (හිගය) | **(120,029,405)** | **(100,743,221)** |
| අතිරික්ත පාරිතෝෂික වෙන්කිරීම් | - | - |
| මූල්‍ය වියදම් | (216,844) | (33,352,622) |
| බදු පෙර අතිරික්තය (හිගය) | **(120,246,249)** | **(134,095,844)** |
| | | |
| එකතුකළ : මෙහෙයුම් නොවන ආදායම් | - | - |
| ස්ථාවර තැන්පතු පොලී ආදායම | 3,150,909 | 117,000 |
| පෙර බදු ශුද්ධ අතිරික්තය (හිගය) | **(117,095,340)** | **(133,978,844)** |
| | | |
| **ආදායම් බදු** | 307,214 | - |
| **වර්ෂයේ අතිරික්තය (හිගය)** | **(117,402,554)** | **(133,978,844)** |

# ශේෂ පත්‍රය - 2016 දෙසැම්බර් 31 වන දිනට ශේෂ පත්‍රය

| වත්කම් | 2016.12.31 (රුපියල්) | 2015.12.31 (රුපියල්) |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| මුදල් හා බැංකු ශේෂය | 76,663,031 | (28,707,565) |
| ණය ගැතියෝ | 10,811,023 | 43,912,053 |
| තොගය | 11,483,637 | 8,834,824 |
| කාර්ය මණ්ඩලයේ දස මාසික ණය ලබාදීම් | 21,507,043 | 21,369,881 |
| අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු ශේෂ | 108,096,030 | 91,947,753 |
| | **228,560,765** | **137,356,946** |
| **ස්ථාවර වත්කම්** | | |
| ඉඩම් | 2,856,612,140 | 2,856,612,141 |
| ගොඩනැගිලි | 1,243,588,617 | 1,223,818,817 |
| අධිබලැති විදුලි කුළුණු | 1,372,978 | 2,048,185 |
| අධිබලැති විදුලි බල්බ | 1,266,922 | 2,766,341 |
| යන්ත්‍ර සහ උපකරණ | 93,062,982 | 111,092,535 |
| පරිගණක | 3,517,471 | 4,188,629 |
| මෝටර් රථ | 376,222 | 2,141,778 |
| ක්‍රීඩා උපකරණ | 27,459,563 | 32,095,189 |
| ලී බඩු සහ උපකරණ | 17,832,243 | 12,383,983 |
| කාර්යාලීය සහ අනෙකුත් උපකරණ | 8,023,582 | 9,618,343 |
| තිර රෙදි | 616,564 | - |
| සිදු කෙරෙමින් පවතින වැඩ | 297,146,860 | 253,037,812 |
| ස්ථාවර තැන්පත් | 29,767,006 | 29,671,032 |
| | **4,580,643,155** | **4,539,471,785** |
| **සමස්ථ වත්කම්** | | **4,856,831,731** |
| **ප්‍රාග්ධන ස්කන්ධය සහ වගකීම් - ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ණය හිමියෝ | 7,532,472 | 5,808,072 |
| ආරක්ෂිත තැන්පතු | 9,115,537 | 10,669,696 |
| ලැබූ අත්තිකාරම් මුදල් | 2,869,115 | 2,925,624 |
| බදු වෙන්කිරීම් | 792,240 | 340,803 |
| උපචිත වියදම් හා අනෙකුත් ගෙවිය යුතු වියදම් | 13,173,499 | 9,181,293 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 70,181,833 | 56,280,460 |
| | **104,164,696** | **85,205,946** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පාරිතෝෂික දීමනා | 65,369,896 | 44,215,170 |
| | **65,369,896** | **77,113,520** |
| **සමස්ථ වගකීම්** | **169,534,592** | **162,319,466** |
| **ශුද්ධ වත්කම්** | **4,639,669,328** | **4,694,512,265** |
| **ශුද්ධ වත්කම්/ ප්‍රාග්ධන ස්කන්ධ** | | |
| රජයේ ප්‍රදාන | 6,160,621,629 | 5,985,371,609 |
| සමුච්චිත අරමුදල | (1,412,884,380) | (1,166,215,152) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 9,334,652 | 9,334,652 |
| වර්ෂයේ අතිරික්තය/ ඌනතාවය | (117,402,554) | (133,978,844) |
| **මුළු ප්‍රාග්ධන ස්කන්ධ සහ වගකීම්** | **4,639,669,328** | **4,694,512,265** |

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2016.12.31 (රුපියල්) | 2015.12.31 (රුපියල්) |
|---|---|---|
| **මෙහෙයුම්වලින් ලද මුදල් ප්‍රවාහය** | **(117,402,554)** | **(133,978,844)** |
| **බදු පෙර අතිරික්තය හෝ ශුද්ධ ඌනතාවය** | | |
| | | |
| සමුච්චිත අරමුදලට පසුගිය වසරවල කරන ලද ක්ෂය ගැලපීම් | | |
| ක්ෂය වෙන්කිරීම් | 89,648,834 | 89,841,680 |
| පසුගිය වසරවල කරන ලද ක්ෂය ගැලපීම් | - | - |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - |
| පාරිතෝෂික වෙන්කිරීම් | 22,539,050 | 4,224,894 |
| | | |
| (වැඩිවීම්) / අඩුවීම් තොග | (4,103,390) | 134,613 |
| (වැඩිවීම්) / අඩුවීම් ගෙවිය යුතු ශේෂය | 18,814,526 | (29,379,898) |
| පාරිතෝෂික දීමනා ගෙවීම් | (1,384,325) | (651,332.30) |
| **මෙහෙයුම්වලින් ලද ශුද්ධ මුදල් ශේෂය** | **6,668,723** | **37,022,614** |
| | | |
| ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය | | |
| දේපළ, පිරියත සහ යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම | 224,303,395 | (142,885,490) |
| බදු ගෙවීම | | - |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය | | - |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ශේෂය** | **180,000,000** | **(322,885,490)** |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| සමුච්චිත අරමුදලෙහි වෙනස්වීම් | 92,718 | 2,284,524 |
| රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | 175,250,000 | 243,000,000 |
| **මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ශේෂය** | **175,342,718** | **245,284,524** |
| | | |
| මුදල් හා මුදල් සමාන දෑ වලින් ශුද්ධ වැඩිවීම් | 105,370,596 | (114,623,580) |
| වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල්වලට ආසන්න දෑ | (28,707,565) | 85,916,015 |
| **වර්ෂ අවසානයේයේදී මුදල් හා මුදල්වලට ආසන්න දෑ ශේෂය** | **76,663,031** | **(28,707,565)** |

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**

# විගණකාධිපති වාර්තාව 2016

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } පීඑස්/ඊ/එස්එන්එස්සීඒ/ එෆ්ඒ/2016 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018 මාර්තු 13 දින

සභාපති,
සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 9 (2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරිතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. මිලියන 468.9 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ගෙවා තිබූ රු. 46,257,776 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදලින් රු. 32,859,055 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිට නිරවුල් කර තිබුණද අදාළ නිරවුල් කිරීම ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් අත්තිකාරම් ගිණුම සහ කෙරීගෙන යන වැඩ ගිණුම එම වටිනාකමෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී ලෙස රු. 5,718,147 ක් දක්වා තිබුණද බැංකු ශේෂ සනාථ කිරීම අනුව එය රු.6,706,120 ක් වූයෙන් ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු. 987,973 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

3

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන් 5 කට අදාලව දක්වා තිබූ ශේෂයන් ඊට අදාළ උපලේඛන සමග සැසඳීමේදී එකතුව රු.5,941,349 ක වෙනසක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවිය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | අවසාන තොගය | 11,483,637 | භෞතික තොග සත්‍යාපන වාර්තා |
| (ආ) | ක්‍රීඩා සංගම් වලින් ලැබිය යුතු ශේෂ | 10,172,936 | ශේෂ සනාථන ලිපි |
| (ඇ) | ලැබිය යුතු ශේෂ | 33,536,437 | ශේෂ සනාථන ලිපි |
| | | 55,193,010 | |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ශේෂවල එකතුව රු. 43,709,373 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වලින් රු.28,246,743 ක් වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වී තිබුනද අයකර ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ආ) වර්ෂ තුනක කාලයක් ගත වී තිබූ එකතුව රු. 437,878 ක් වූ ගෙවිය යුතු ශේෂ 11 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 හා 2013 වර්ෂ සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වෙනුවෙන් රු.8,939,262 ක් වෙන්කර තිබුණද එම බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට හෝ ගිණුම්වල නිරවුල් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

4

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

---

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය | මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 03කට පෙර අයවැය ලේඛනය පිළියෙල කර එය අධිකාරියේ පාලක මණ්ඩලය විසින් අනුමත කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු. 100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දීමට හැකි වුවද අවස්ථා 7කදී එකතුව රු. 2,388,905 ක් වූ අත්තිකාරම් මුදල් නඩත්තු අංශයේ සහ මිලදී ගැනීම් අංශයේ විෂය ලිපිකරුවන් වෙත ලබා දී තිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

---

3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.117,402,554 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.246,797,596 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.129,395,042 කින් හෙවත් සියයට 52 කින් වර්ධනය වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රාජ්‍ය ප්‍රදාන රු. 29,050,000 කින් හෙවත් සියයට 22 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

5

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමක් සිදු වී තිබුණි. එහෙත් 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ඌනතාවය වර්ධනය වී තිබූ අතර නැවතත් සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමිකය, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සහ රාජ්‍ය බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.90,592,946 ක් වූ අධිකාරියේ දායකත්වය 2015 වර්ෂයේ හැර අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.150,745,273 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ ජංගම අනුපාතය 1.22 සිට 2.19 දක්වාද ක්ෂණික අනුපාතය 1.13 සිට 2.08 දක්වාද වර්ධනය වී තිබූ අතර ඒ අනුව ආයතනයේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව ඉහළ ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අධිකාරිය ස්ථාපිත කරන ලද 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරී පනත අනුව ආයතනයේ අරමුණු මොනවාද යන්න නිශ්චිතව දක්වා නොමැති වුවද, ආයතනයේ කර්තව්‍යයන් ලෙස ජවන හා පිටිය තරඟ, පිහිනුම් තරඟ පැවැත්වීමට හා පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා යටිතල පහසුකම් සැපයීම, විභාග සම්මන්ත්‍රණ හා සමුළු පැවැත්වීමට සහ මහජන රසාස්වාදය වෙනුවෙන් ගෘහස්ථ ශාලා පහසුකම් සැපයීම, ක්‍රීඩකයන් සඳහා නේවාසික පහසුකම් සැපයීම සහ එම කාර්යයන් සඳහා පැමිණෙන අයගේ රථවාහන නවතා තැබීමේ පහසුකම් සැපයීම දක්වා තිබුණි.මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විශේෂ මූල්‍ය ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂයේදී මීටර් 400 හා මීටර් 200 කෘතිම ධාවන පථ නැවත ඇතිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 99 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් එම ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 හා 2012 වර්ෂවලදී අධිකාරිය විසින් රු.24,919,800 ක් රාජ්‍ය බැංකුවක සත්දින නිවේදන තැන්පතු යටතේ ආයෝජනය කර තිබූ අතර 2016 වර්ෂයේ මුල් මාස හතර සහ අවසාන මාස 08 සඳහා පිළිවෙලින් සියයට 4.5 ක් හා සියයට 5.75 ක පොලී ප්‍රතිශතයක් ලැබී තිබුණි. මෙම සත්දින නිවේදන තැන්පතු සඳහා 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු. 6,706,120 ක පොලී මුදලක් ලැබී තිබූ අතර බැංකුව විසින් මෙම පොලිය සඳහාද සත්දින නිවේදන තැන්පතු වලට අදාළ පොලී ගෙවා තිබුණි. ඉහත ආයෝජන මුදල් දිගුකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කළේ නම් ඉහළ පොලී ආදායමක් ලබා ගැනීමට හැකියාව තිබුණද සත්දින නිවේදන තැන්පතුවල ආයෝජනය කිරීම හේතුවෙන් අධිකාරියට මූල්‍යමය වශයෙන් වාසිදායක තත්ත්වයක් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) ක්‍රීඩා තරඟ හා පුහුණුවීම් සඳහා දුරබැහැර ප්‍රදේශවල සිට පැමිණෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ නවාතැන් පහසුකම් සපයා දීමේ අරමුණින් සුගතදාස ක්‍රීඩා හෝටලය ඉදිකර තිබුණද මුදල් අයකිරීමකින් තොරව අමුත්තන් සඳහා නවාතැන් පහසුකම් ලබා දී තිබුණි. එසේම ක්‍රීඩා හෝටලය තුළ ස්ථාපිත කර ඇති ආරක්ෂිත කැමරා පද්ධතිය වර්ෂයක කාලයක සිට අක්‍රියව පැවතුණි.

(ඇ) විශ්‍රාම වැටුප් පාරිතෝෂික වෙන් කිරීම රු. 2,770,919 ක් දිගු කාලීනව ආයෝජනය කිරීම වෙනුවට ලංකා බැංකු ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබුණි.

### 4.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 135 ක් වූ ප්‍රධාන ක්‍රීඩාගාරයේ වහළය හා ලී පොළවෙහි අලුත්වැඩියා කටයුතුවලට අදාළ කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් 03 දින ප්‍රදානය කර තිබූ අතර 2016 නොවැම්බර් 30 දින එම අලුත්වැඩියා කටයුතු අවසන්

7

කිරීමට ඉලක්ක කර තිබුණි. එසේ වුවද, ඇස්තමේන්තුවේ දෝෂ සහගත තත්ත්වයන් මත 2016 නොවැම්බර් 31 වන විටද ලී පොළවේ අලුත්වැඩියා කටයුතු ඉටු කර නොතිබුණි.

(ආ) සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේ ජල නිවාරණ කටයුතු සහ බිම ගඩොල් ඇතිරීම සඳහා රු.මිලියන 29.45 ක කොන්ත්‍රාත්තුවක් 2016 පෙබරවාරි 02 දින පිරිනමා තිබූ අතර 2016 දෙසැම්බර් 31 දින වන විට එම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව තිබුණ ද 2016 දෙසැම්බර් 31 දින වන විටද එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරිය විසින් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 අගෝස්තු 15 දිනය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිගුකාලීන දැක්මක් සහිතව අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් ඇතුළත් කර අධිකාරිය විසින් සකස් කළ බව දැක්වෙන ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

වැය විෂයයන් 13 ක ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සියයට 28 සිට සියයට 121 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණි.

8

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (ආ) ණයගැති හා ණයහිමි පාලනය | (i) උපරිම ණයගැති සීමාව හා කාලය සම්බන්ධයෙන් සීමා නිර්ණය නොකිරීම.<br>(ii) ණයගැතියන්ගේ ශේෂ සනාථන ලබා නොගැනීම.<br>(iii) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් නොකිරීම. |
| (ඇ) ගිණුම්කරණය | (i) ගිණුම්කරණය සඳහා මිලදී ගත් මෘදුකාංගය මගින් සම්පූර්ණ ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොකිරීම.<br>(ii) වගකිව යුතු නිලධාරියෙකුගේ අනුමැතියක් සහිතව ජ`නල් සටහන් නොයෙදීම. |
| (ඈ) අයවැය පාලනය | අයවැය සහ සත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් පැවතීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

9

**<u>සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව සඳහා යාවත්කාලීන තෙරතුරු.</u>**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති**

නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

(අ) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.
(ආ) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

**2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්**

නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

2017.12.31 දිනට නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ශේෂවලින් (රු. 43,709,373.00 ) 2017.06.30 දිනට රු. 4,652,171.32 අය කරගෙන ඇත. රු. 28,246,743.00ක් වූ වර්ෂ 10ට පෙර ණය ශේෂ අයකර ගැනීමේ නෛතික ක්‍රමවේදය සලකා බලමින් සිටී.

(ආ) මෙම ශේෂ 11 සඳහා නියමිත තොරතුරු නොවන බැවින් කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර තීරණයක් ලබා ගැනීමට නියමිතය.

(ඇ) මෙම මුදල ආයතනය මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ආරක්ෂණ සංකල්පයට අනුව කරනු ලැබූ වෙන්කිරීමක් පමණි. මෙම මුදල ගෙවන ලෙස දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුව විසින් කිසිදු ලිපියක් / නියෝගයක් දී නොමැත. එම නිසා නිරවුල් කිරීමේ ක්‍රියාමාර්ගයන්ද ගතනොහැකිය.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

(අ) නිවැරදි කර ඇත.
(ආ) මෙම අත්තිකාරම් දැනට පියවා ඇති අතර, වර්තමානයේ රු. 100,000.00 ට වැඩි අත්තිකාරම් ලබාදෙන්නේ නැත.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

එකඟ වේ. වර්තමානයේ ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-------------------------------------

2015.12.31 දිනට කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව පහළගොස් තිබුණි. 2016.12.31 දිනය ඉහළ ගොස් ඇත. ඉදිරියේ දී මධ්‍යස්ථව පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතී.

**4. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

4.1 <u>කාර්ය සාධනය</u>

ව්‍යාපෘතියක් සිදු කිරීමට පෙර එම භූමියේ සබ්‍යතා අධ්‍යනයක් සිදුකළ යුතු බැවින් එම පරීක්ෂණ සිදුකර ඇත. තවද, මෙම ව්‍යාපෘතිය සඳහා 2016 අගෝස්තු මස මූල්‍ය ප්‍රතිපාදන ලැබුණු අතර පළමු වර ටෙන්ඩරය අවලංගුවීම නිසා 2016 වර්ෂයේ සිදුකිරීමට නොහැකි වූ අතර මෙම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩරය ජාත්‍යන්තර මිළ ගණන් කැඳවීමෙන් සිදුකළ යුතුවූ බැවින් ඒ සඳහා දිගු කාලයක් ගතවූ අතර මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලැබූයේ ක්‍රීඩා අමාත්‍යාංශය මඟිනි.

**4.2.** <u>කළමනාකරණ ක්‍රියාකාරකම්</u>

(අ) වර්තමානයේ නිවැරදි කර ඇත.

(ආ) මේ සඳහා මූලික විමර්ශනයක් පැවැත්වීමට ක්‍රියා මාර්ග ගෙන ඇති අතර සේවය කරන ලද එක් සේවකයෙකු සේවය හැරගොස් ඇත. මූලික විමර්ශන වාර්ථාවට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට නියමිතවේ.

2015 වර්ෂයේ සිට ක්‍රීඩා හෝටලය පූර්ණ නවීකරණයකට ලක්කිරීම ආරම්භ වූ බැවින් එහි සවිකර තිබූ සියළුම ආරක්ෂක කැමරා ගලවා ඉවත් කළ අතර එහි නවීකරණ කටයුතු අවසන් වූ වහාම ආරක්ෂක කැමරා පද්ධතිය ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී.

**4.3** <u>ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය</u>

(අ) ලී පොළොව අලුත්වැඩියා සිදුකිරීම ආරම්භයේදී සම්පූර්ණ ලී පොළොව අලුත්වැඩියා කළ යුතු බව අදාල කොන්ත්‍රාත් ආයතනය හා උපදේශක ආයතනය මඟින් නිර්දේශ කළ අතර එය සම්පූර්ණයෙන් සිදු කිරීමට විශාල පිරිවැයක් වැය වන බැවින් උක්ත කාරණය වෙනම ව්‍යාපෘතියක් වශයෙන් සිදුකිරීමට සිදුවන බැවින් එම අයිතම ප්‍රධාන ක්‍රීඩාගාරයේ වහළය අලුත්වැඩියා කිරීම ව්‍යාපෘතියෙන් ඉවත් කිරීමට මෙම අධිකාරිය සහ උපදේශන ආයතනය තීරණය කරන ලදි.

(ආ) මෙම ව්‍යාපෘතිය සිදුකරගෙන යාමේදී උත්සව අවස්ථාවන් සඳහා ගෘහස්ථ ක්‍රීඩාංගනය වෙන් කිරීම් සඳහා ලබාදෙන ලද අතර එම දිනයන්හිදී මෙන්ම වර්ෂා දිනයන්හිදීද මෙම ව්‍යාපෘති කටයුතු සිදුකිරීමට නොහැකි විය. තවද මෙය අලුත්වැඩියා කටයුත්තක් බැවින් ඇස්තමේන්තු සකස් කිරීමේදී හඳුනා නොගත් අමතර කාර්යයන් සිදුකිරීමට වූ නිසා නියමිත කාලවකවානුවේදී අවසන් කිරීමට නොහැකි විය.

**5.** <u>ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය</u>

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017.12.31 මූල්‍ය ප්‍රකාශන නියමිත දින ඉදිරිපත් කර ඇති අතර, එම වරද නිවැරදි කර ඇත.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------
පිළියෙල කර ඇත.

**5.3 අයවැය පාලනය**

-------------------
නිවැරදි කර ගැනීමට කටයුතු කරමින් පවතී.

**5.4 පද්ධති හා පාලනයන්**

------------------------

**(අ) වත්කම් කළමනාකරණය**

නිවැරදි කර ඇත.

**(ආ) ණයගැති හා ණයහිමි පාලනය**

(i) නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.
(ii) නිවැරදි කර ඇත.
(iii) නිවැරදි කර ඇත.

**(ඇ) ගිණුම්කරණය**

(i) 75%ක් පමණ නිවැරදි කර ඇත. ඉතිරිය නිවැරදි කරමින් පවතී.
(ii) නිවැරදි කර ඇත.

**(ඈ) අයවැය පාලනය**

නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී.

**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය**
**තැ.පෙ. 2211, ආතර් ද සිල්වා මාවත,**
**කොළඹ 13.**

**ගෘහස්ථ ක්‍රීඩාංගනය :** 0112 445 677, 2 422 841, 2 384 490, 2 384 385
**එළිමහන් ක්‍රීඩාංගනය :** 0112 423 333
**ෆැක්ස් :** 0112 445 675
**ඊමේල් :** chairmansnsca@yahoo.com, sugathadasaindoor@gmail.com

**බෝගම්බර ක්‍රීඩාංගනයඃ** 0812 235 395
**නුවරඑළිය තුරඟ තරඟ පිටියඃ** 0522 222 659
**බෙලිඅත්ත පිහිනුම් තටාකයඃ** 0472 251 685